විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ
කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி மற்றும்
வாழ்க்கை தொழிற்பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SCIENCE, TECHNOLOGY, RESEARCH, SKILLS DEVELOPMENT &
VOCATIONAL TRAINING AND KANDYAN HERITAGE

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය
தேசிய பயிலுநர் மற்றும் கைத்தொழில் பயிற்சி அதிகாரசபை
National Apprentice & Industrial Training Authority

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT 2018

971. ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය.
971, ஸ்ரீ ஜயவர்த்தனபுர மாவத்தை,வெலிக்கடை, இராஜகிரிய.
971, Sri Jayawardanapura Mawatha, Welikada, Rajagiriya

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

වාර්ෂික වාර්තාව

2018

පටුන...

සභාපතිතුමාගේ පණිවුඩය	01
සංඥාපනය	02
ඉතිහාසය	03
හැඳින්වීම	04 - 05
දැක්ම හා මෙහෙවර	06
2018.....	07 - 08
1. ආයතනික තොරතුරු	09 - 10
2. පාලක මණ්ඩලය	11 - 12
3. අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්	13
4. දිස්ත්‍රික් කළමනාකරුවන්	14
5. පරිපාලන ව්‍යුහය	15
6. අධිකාරියේ අරමුණු	16
7. අධිකාරියේ ප්‍රධාන කාර්යයන්	16
8. පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්	17 - 21
9. දත්ත නිරූපණය සහ විශ්ලේෂණය	22 - 54
10. අනෙකුත් ක්‍රියාකාරකම්	55 - 73
11. අවසන් ගිණුම් වාර්තා	74 - 81
12. විගණන වාර්තාව හා පිළිතුරු	82 - 94

සභාපතිතුමන්ගේ පණිවුඩය....



ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස 1971 අංක 49 දරන ආධුනිකත්ව පනත යටතේ ආරම්භ කරන ලද, නැවත 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස නම් කොට තව දුරටත් තම වගකීම සහ කාර්යභාරයන් මනා ලෙස අවබෝධ කර ගනිමින් අප අධිකාරිය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ තවදුරටත් දැවැන්ත කාර්යභාරයක් ඉටු කරමින් ඉහළ ස්ථානයක වැජඹෙන බව හඳ පිරි සතුටින් දැනුම් දෙමි.

මාගේ ආයතනයෙහි ප්‍රධාන අරමුණ සහ අභිලාෂය වනුයේ රටේ ආර්ථිකයට අවශ්‍ය නිපුණතාවයෙන් හෙබි තරුණ පරපුරක් බිහි කිරීමටය.

එහෙයින් අප වාර්ෂික වාර්තාව මඟින් අධිකාරියේ මාගේ පාලන කාලය තුළ Dreamron, Insee, Tokyo යනාදි ආයතනයන් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් තැබීම මඟින් පුහුණු අවස්ථා රාශියක් තරුණ පරපුර හිමි කර ගැනීමට කටයුතු කිරීමත්, "සාර්ථකත්වයට නොවරදින මඟ - තරුණ ඔබේ අත ළඟ" යනුවෙන් සමස්ත ලංකා දැනුවත් කිරීමේ වැඩ සටහන තුළින් රැකියා අවස්ථා 25000 ක් බඳවා ගැනීම දෙගුණ කිරීමටත් ඒ හරහා රැකියා විරහිත තරුණ පරපුරට රැකියා අවස්ථා ලබා දීම තුළින් සවිබල ගැන්වීමත් මාගේ මුඛ්‍ය පරමාර්ථයක් විය.

එපමණකින් නොනවතින ක්ෂේත්‍රයන් කිහිපයක් සමස්ත ලංකා සේවා යෝජකයෝ තුළින් දැනුවත් කිරීමේ අවස්ථාවන් පිළිබඳව සාකච්ඡා කිරීම තුළින් වෘත්තීය පුහුණුව පිළිබඳ නව පුනරුදයක් ඇති කිරීමට මා හට හැකි වූ බව හා එසේම ත්‍රීවිලර් රියදුරන්ගේ පටු මානසිකත්වයෙන් මිදවීමේ අරමුණින් ඔවුන් බහුවිධ නිපුණයෙකු බවට පත් කිරීම සඳහා Multi Expert Skills Craftsman ලෙස වෘත්තියක් හඳුන්වාදීම යන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ආයතනය දියුණුව කරා ගෙන යාමේදී ක්‍රියාත්මක වූ මෙම ක්‍රියාකාරකම් වල ප්‍රගතිය 2018 වාර්ෂික වාර්තාව මඟින් දිගහැර දැක්විය හැක.

ඉතාමත් තරඟකාරී පරිසරයක් තුළ විවිධ දුෂ්කරතා වලට සාර්ථක ලෙස මුහුණ දෙමින් මාගේ අරමුණු සහ කාර්යයන් සඵල කර ගැනීමට හැකි වුයේ මාගේ කාර්ය මණ්ඩලයේ නොමඳ කැපවීම නිසා බැවිණි. එම ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට කටයුතු කරයි.

මාගේ පාලක මණ්ඩලයේ සහයෝගය හා ආයතනික කාර්යභාරයත් ආධුනිකයන් හට පුහුණු අවස්ථා ලබා දුන් රාජ්‍ය හා පෞද්ගලික අංශයන් වෙත ස්තුති කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි.

වෛද්‍ය සාරංග අලහප්පෙරුම

සභාපති

සංඥාපනය

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තිය අනුව අධිකාරිය විසින් වාර්ෂික වාර්තාව පිළියෙල කළ යුතුව ඇත.

මෙම වාර්තාවේ කොටස් 03ක් අඩංගු වන අතර පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය පිළිබඳ විස්තර, පුහුණුව සම්බන්ධව සංවර්ධන කටයුතු සහ වර්ෂයට අදාල සංක්ෂිප්ත වාර්ෂික ගිණුම් වාර්තාව හා විගණකාධිපති වාර්තාවෙහි ඇතුලත් තොරතුරු අන්තර්ගතකොට මෙම වාර්තාව පිළියෙල කර ඇත.

2018 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක වන දිස්ත්‍රික් කාර්යාල 25 හි කළමනාකරුවන් හා ජාතික ආයතනයන්හි ආයතන ප්‍රධානීන් මෙන්ම ප්‍රධාන කාර්යාලයෙහි ඒ ඒ අංශයන්හි අංශ ප්‍රධානීන් විසින් ලබා දුන් තොරතුරු පදනම් කොට ගන්නා ලදී. එම තොරතුරු විශ්ලේෂණය කර සංක්ෂිප්තව මෙම වාර්තාව සකස් කර ඉදිරිපත් කරන ලදී.

සැලසුම් හා අධීක්ෂණ අංශය

2018

ඉතිහාසය

1. මෙයට වසර 47 කට පමණ පෙර ශ්‍රී ලංකාව තුළ ඇති වූ තරුණ අසහනයට පිළියමක් ලෙස රජයේ මැදිහත් වීම මත 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය පිහිටුවන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන හා ජාත්‍යන්තර කම්කරු සහයෝගය ඇතිව ආධුනිකත්ව පුහුණුව සම්බන්ධ විෂයමාලා සංවර්ධනය, පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමිති නිර්ණය කිරීම, දුරස්ථ අධ්‍යාපනය සඳහා අදාල උපදෙස් පිළියෙල කිරීම, ජාතික ශිල්පීය සහතික ප්‍රදානය කිරීම ආදී විවිධ ජයග්‍රහණයන් ජාතික ආධුනිකත්ව මණ්ඩලය යටතේ ළඟා කරගන්නා ලදී.

2. 1983 වසරේදී ප්‍රථම ජාතික පුහුණු ආයතනය ලෙස ආධුනිකත්ව අභ්‍යාස ආයතනය ජර්මන් ෆෙඩරල් ජනරජයේ ආධාර ඇතිව නො.581, ගාලු පාර, කටුබැද්ද, මොරටුව යන ස්ථානයේ පිහිටුවන ලදී. 1985 දී දෙවන ජාතික පුහුණු ආයතනය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ලෝක කම්කරු සංවිධානය සමඟ ඒකාබද්ධව තාක්ෂණවේදයන් පුහුණු කිරීමේ ආයතනය නමින් 18 කණුව, පන්සල පාර, කටුනායක යන ස්ථානයේ පිහිටුවන ලදී.

3. 1989 දී තෙවන ජාතික පුහුණු ආයතනය ලෙස ජපන් රජයේ ආධාර මත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය නො.07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය යන ස්ථානයේ පිහිටුවන ලදී.

4. ආයතනයේ කටයුතු තවත් පුළුල් කිරීම සඳහා 1990 දී අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ ii කොටස යටතේ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.

5. අනතුරුව ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ පරිපාලනය පළාත් කාර්යාල ලෙස විමධ්‍යගත කරන ලද අතර තව දුරටත් දිස්ත්‍රික් කාර්යාල හා පර්ෂද කාර්යාල ලෙසට ක්‍රමයෙන් විකාශනය විය.

6. තෘතීය අධ්‍යාපන පනතට අනුව ඉංජිනේරු උපාධි ආයතනයක් සහ තෘතිය අධ්‍යාපන ආයතන මඟින් පවත්වාගෙන යන උසස් ඩිප්ලෝමා සඳහා අදාල යන්ත්‍රාගාර පුහුණුව දෙනු ලැබේ.

7. හතරවන ජාතික පුහුණු ආයතනය ජර්මන් ජන රජය GIZ හා KFW ආයතන වල මූල්‍ය ආධාර මත කිලිනොච්චියේ ආරම්භ කිරීමට 2014 දෙසැම්බර් 04 දින මුල් ගල තබන ලදි.

8. 2014 සිට අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන වල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මඟින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතන වල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබුවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

   හතරවන ජාතික පුහුණු ආයතනය ලෙස ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය 2016 ජූලි 18 දින විවෘත කොට ආරම්භ කරන ලදී.

හැඳින්වීම

නෛතික ව්‍යූහය....

1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව ජාතික පනත යටතේ ජාතික ආධුනිකත්ව මණ්ඩලය ලෙස ආරම්භ කරන ලදුව 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය ලෙස ස්ථාපිත විය.

තම කාර්යභාරයන් නිසි ලෙස ඉටු කරමින් අභිමානවත් 47 වසර පසු කරන අප අධිකාරියේ 1971 සිට 2018 දක්වා වෘත්තීය පුහුණු කිරීම් ක්ෂේත්‍රය තුළ පැමිණි ගමනට විශාල ශක්තියක් එක් කළ සාමාජිකයන් පිළිබඳ බිඳක් දැක්වීමට කැමැත්තෙමු.

1. පුහුණු අංශය

බඳවාගැනීම් අංශය, පුහුණු කිරීම් අංශය, යන්ත්‍රාගාර පුහුණු අංශය, කාර්යස්ථ පුහුණු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත පුහුණු අංශය දිස්ත්‍රික්ක 25 හරහා සමස්ත ශ්‍රී ලංකාව පුරා පුහුණු කටයුතු සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පවත්වාගෙන යාම යන අරමුණු සාක්ෂාත් කිරීමට උරදෙමින් කටයුතු කරයි.

2. තත්ත්ව අංශය

විෂයමාලා සංවර්ධන අංශය, තත්ත්ව කළමනාකරණ අංශය, ජාතික වෘත්තීය පරීක්ෂණ අංශය, ජාතික වෘත්තීය සුදුසුකම් අංශය, ඇගයීම් අංශය, සහතික අංශය යන ප්‍රධාන අංශයන්ගෙන් සමන්විත තත්ත්ව අංශය පුහුණු අංශයේ පුහුණු කටයුතු වඩාත් ක්‍රමවත්ව සහ කාර්යක්ෂමව සිදු කිරීමට අවශ්‍ය සම්පත් සංවර්ධනය කරමින්, ආධුනිකයන්ගේ සහ ආයතනයේ ගුණාත්මක භාවය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මෙවලම් සම්පාදනය කරමින් අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමට විශාල ශක්තියක් ලබාදේ.

3. සැලසුම් හා අධීක්ෂණ අංශය

සියලු දිස්ත්‍රික් කාර්යාල, ජාතික ආයතන, පරිපාලන, තත්ත්ව, මූල්‍ය හා පුහුණු යන සියලුම අංශයන් ආවරණය කරමින් ඔවුන්ගේ ප්‍රගතියන් දත්ත කළමනාකරණ පද්ධතිය හරහා ලබා ගනිමින්, මාසික ප්‍රගති වාර්තා, කාර්තුමය වාර්තා, වාර්ෂික වාර්තා සහ අවශ්‍යතාවය අනුව අනෙකුත් වාර්තා ජනනය කරමින් රේඛීය අමාත්‍යංශය ඇතුළු අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට අවශ්‍ය පරිදි තොරතුරු ලබා දෙමින් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය බාහිර පරිසරය සමඟ සම්බන්ධීකරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

තව ද අධිකාරියේ කටයුතු නිසි පරිදි මෙහෙය වීම සඳහා අවශ්‍ය සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ අවශ්‍යතාව අනුව විවිධ ආකාරයෙන් සැලසුම් සකස් කිරීම ප්‍රධාන වගකීම වේ.ඒ වගේම අධිකාරියේ පුහුණු හා පුහුණුව සම්බන්ධ අධීක්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමද මෙම අංශය මඟින් ඉටුකරනු ලබයි. තවද පුහුණුවට සියලුම තොරතුරු සහ සේවකයන් සම්බන්ධ තොරතුරු එක්රැස් කිරීමට අදාල කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළියෙළ කිරීමේ හා පරිපාලනය කිරීමේ කටයුතු ද මෙම අංශයේ ප්‍රධාන කාර්යයභාරයකි.

4. පරිපාලන අංශය

නිලධාරීන් බඳවාගැනීම් අංශය, ප්‍රවාහන අංශය, ඉදිකිරීම් හා නඩත්තු අංශය, නීති අංශය, නිලධාරී පුහුණු අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත අතර, මානව සම්පත් හා අනෙකුත් භෞතික සම්පත් කාර්යක්ෂම ලෙස පාලනය හා උපයෝජනය කරමින් ආයතනයේ ඉදිරි ගමනට දැවැන්ත ශක්තියක් ලබාදේ.

5. මූල්‍ය අංශය

ප්‍රසම්පාදන අංශය, ගබඩා අංශය, ගෙවීම් අංශය, වැටුප් අංශය සහ පොත් තැබීම් අංශය යන ප්‍රධාන අංශ වලින් සමන්විත වන අතර වාර්ෂිකව සැලසුම් අංශය මඟින් පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී හා සංයුක්ත සැලසුම් අනුව පිළියෙල කරනු ලබන වාර්ෂික අයවැය ලේඛනය නිසි අයුරින් මෙහෙයවමින් ආයතනයෙහි සියලු කටයුතු සඳහා සජීවී බවක් එක් කිරීමට ප්‍රධාන දායකත්වය ලබාදේ.

6. විගණන අංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවමින් විගණකාධිපති දෙපාර්තමේන්තුව, රේඛීය අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් ආයතන සමඟ සම්බන්ධ වෙමින් කටයුතු කරයි. අභ්‍යන්තර පාලනය සහ ආයතනයේ කටයුතු වල විනිවිදභාවය විධිමත් ලෙස පවත්වාගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු සම්බන්ධීකරණය සහ කළමනාකාරීත්වයට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් විශාල මෙහෙයක් ඉටු කරනු ලැබේ.

දැක්ම

මානව සම්පත් සංවර්ධනය මඟින් ශ්‍රී ලංකාවේ සමෘද්ධිය සැලසීම සඳහා සාර්ථක දායකත්වයක් දෙමින් කාර්යක්ෂම පුහුණු කිරීමේ ආයතනය බවට පත්වීම.

මෙහෙවර

කර්මාන්ත ක්ෂේත්‍රයේ නිපුණ මිනිස් බල අවශ්‍යතා සපුරාලනු පිණිස මනාසේ සකසන ලද උසස්ම වෘත්තීය මට්ටමේ නිපුණතා පුහුණු වැඩසටහන් තුළින් තරුණ තරුණියන් හට වෘත්තීය හා කාර්මික පුහුණුව ලබා දීම.

2018 .....

කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	24,283
මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව	5,639
ජාතික ආයතන	1,688
අර්ධකාලීන පාඨමාලා	1,568
රැකියාස්ථ පුහුණුව (වෙනත් පුහුණු ආයතන)	8,749
විශේෂ කර්මාන්ත පුහුණු	8,994





- මෙම වසර තුළ අවබෝධතා ගිවිසුම් 04ක් අත්සන් තබන ලදී. එය Dreamron (Pvt) සමඟ ද, Insee Cement Pvt සමඟ ද, Tokyo Cement Limited සමඟ ද, National Institute of Mental Health සමඟ ද අත්සන් තබන ලදී.
- සුපිරි වෙළඳසැල් වලට අදාල ශ්‍රමිකයින් පුහුණු කිරීම සඳහා අමාත්‍ය සරත් අමුණුගම මහතාගේ අදහසක් අනුව Food City, Keels Super, Laughs iy Spar Super Markets සමඟ අප ආයතනය පුහුණු කිරීම අවස්ථා පුළුල් කරන ලදී.
- රැකියා 25000 ව්‍යාපෘතිය මෙම වසර තුළ ආරම්භ කරන ලදී.



- ආයතනය සඳහා ආධුනිකයින් බඳවා ගැනීම දෙගුණ කිරීමේ වැඩසටහන සහ හෝටල් ක්ෂේත්‍රය, මෝටර් රථ අලුත්වැඩියා ක්ෂේත්‍රය, ගොඩනැගිලි හා ඉදිකිරීමේ ක්ෂේත්‍රය, වෛද්‍ය හා සෞඛ්‍ය විෂය ක්ෂේත්‍රය යන ක්ෂේත්‍ර 4 මූලික කර ගනිමින් දීප ව්‍යාප්තව වැඩසටහන් පවත්වන ලදී.
- ආධුනිකත්ව පුහුණුවෙහි මාස දෙකක මූලික පුහුණුවක් ලබා දීම අනිවාර්ය අංගයක් ලෙස සිදු කිරීම හා දිස්ත්‍රික්ක මට්ටමින් මූලික පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම සභාපතිතුමාගේ අදහසක් ලෙස ක්‍රියාවට නැංවීම මෙම වසර තුළ සිදු කරන ලදී.



NAITA පුහුණුව පිළිබඳව ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් පිළිගැනීම වැඩි කිරීම සඳහා Nantong Shipping School China සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

- ත්‍රීරෝද රථ රියදුරන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමේ ජාතික වැඩසටහන "ත්‍රී වීල් එකෙන් ෆෝ වීල් එකට" ලෙස දීප ව්‍යාප්තව ආරම්භ කරන ලදී.



- අප ආයතනය හා ජාතික රූපවාහිනිය එක්ව විශේෂ "නුග සෙවන" වැඩසටහනක් 17.02.2018 හෙට්ටිපොලදී පවත්වන ලදී. එහිදී හෝටල් ක්ෂේත්‍රය සඳහා මුලිකත්වය ලබා දෙන ලදී.
- අප ආයතනය හා ස්වාධීන රූපවාහිනී සේවය සමඟ එක්ව විශේෂ "දොරමඩලාව" වැඩසටහන 03.09.2018 දී නියෝජ්‍ය අධ්‍යක්ෂ ජී.එච්.නිලන්ත ද සිල්වා මහතාගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.
- ජාතික රූපවාහිනිය එක්ව "සංහිඳ" විශේෂ වැඩසටහන උප සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 22.10.2018 දින පවත්වන ලදී.
- දීප ව්‍යාප්ත ප්‍රචාරණ වැඩසටහනක් වන ප්‍රසිද්ධ ස්ථානවල හා බස් රථ තුළ NAITA Stickers ඇලවීමේ වැඩසටහන මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.
- වෛද්‍ය ක්ෂේත්‍රයේ ආධුනිකත්ව පුහුණුව පුළුල් කිරීම සඳහා කළුතර දිස්ත්‍රික්කයෙහි පවතින පෞද්ගලික රෝහල් සමඟ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වන ලදී. එමෙන්ම හෝටල් ක්ෂේත්‍රයේ ආධුනිකත්ව පුහුණුව පුළුල් කිරීමට සහ කළුතර දිස්ත්‍රික්කයෙහි පවතින හෝටල්හි කළමනාකාරිතුමා සහ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා පවත්වන ලදී.

ආයතනික තොරතුරු.....


දිස්ත්‍රික් කාර්යාල හා ජාතික ආයතන
ප්‍රධාන කාර්යාලය
දිස්ත්‍රික් කාර්යාල
ජාතික ආයතන
යාපනය
කිලිනොච්චිය
මන්නාරම
මුලතිව්
වවුනියාව
ත්‍රිකුණාමලය
අනුරාධපුරය
පොළොන්නරුව
පුත්තලම
මාතලේ
මඩකලපුව
කුරුණෑගල
මහනුවර
කෑගල්ල
කටුනායක
අම්පාර
ගම්පහ
බදුල්ල
නුවරඑළිය
මොණරාගල
මරදානය
කොළඹ
ප්‍රධාන කාර්යාලය
කටුබැද්ද
කළුතර
රත්නපුරය
හාල්ල
තංගල්ල
මාතර

	ප්‍රධාන කාර්යාලය 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය. දු.ක. 011-2888782 - 7
01	**ඉංජිනේරු තාක්ෂණික ආයතනය** 18 කණුව, පන්සල පාර, කටුනායක. දු.ක. 011-2252833
02	**කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය** නො. 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව. දු.ක. 011-2647393, 011-2643847
03	**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය** නො. 69-ඒ, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය. දු.ක. 011-2572977
04	**ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය** අරිවියල් නගර්, කිලිනොච්චි දු.ක. 021 492 7799, 021 206 0137
	අම්පාර දිස්ත්‍රික් කාර්යාලය නො. 06, ජී. එස්. පටුමග, කල්මුණායිකුඩි 13, කල්මුණේ. දු.ක. 067-2229357
	අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය ගුවන් තොටුපල මාවත, අනුරාධපුරය. දු.ක. 025-2223178
	බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය 4/10, මල්වත්ත පාර, බදුලුපිටිය, බදුල්ල. දු.ක. 055-2230644
	මඩකලපුව දිස්ත්‍රික් කාර්යාලය නො.16/1, නව කල්මුණේ පාර, මඩකලපුව. දු.ක. 065-2228130
	කොළඹ දිස්ත්‍රික් කාර්යාලය නො. 242, හැව්ලොක් ටවුම, කොළඹ 05. දු.ක. 011-2587258, 011-2597671
	ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය නො. 393, වක්වැල්ල පාර, ජූල්ගහ, ගාල්ල. දු.ක. 091-2235628
	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය නො.61/5, මිනුවන්ගොඩ පාර, ගම්පහ. දු.ක. 033-2232874
	හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය නො.39, පල්ලික්කුඩාව පාර, තංගල්ල. දු.ක. 047-2241512
	යාපනය දිස්ත්‍රික් කාර්යාලය නො. 44, සෝමසුන්දරම් ඇවිනිව්, චුන්දිකුලි, යාපනය. දු.ක. 021-2222383
	කළුතර දිස්ත්‍රික් කාර්යාලය 326/2, 3 වන මහල, කෙළින් වීදිය,ගාලුපාර, කළුතර දකුණ. දු.ක. 034-2224239

	මහනුවර දිස්ත්‍රික් කාර්යාලය 108/2/බී, තිවංක බෝධි මාවත, මහනුවර. දු.ක. 081-2201918
	කෑගල්ල දිස්ත්‍රික් කාර්යාලය බණ්ඩාරනායක මාවත, බල්ලපාන, ගලිගමුව. දු.ක. 035-2284931
	කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලය නුවර පාර,අනදපුරම්, කිලිනොච්චිය. දු.ක. 0343942824
	කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය මීගමුව පාර, මල්කඩුවාව, කුරුණෑගල. දු.ක. 037-2223789
	මාතර දිස්ත්‍රික් කාර්යාලය නො. 27 ඒ, විවෘත විශ්ව විද්‍යාල පාර, නූපේ, මාතර. දු.ක. 041-2226958
	මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය 952/1, නල්ලයාර් වීදිය, පරණ මුර් වීදිය, මන්නාරම. දු.ක. 023-2223404
	මාතලේ දිස්ත්‍රික් කාර්යාලය නො.11, පන්සල පාර, මණ්දන්ඩාවල, මාතලේ. දු.ක. 066-2223173
	මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය උසාවි සංකීරණය, මොණරාගල. දු.ක. 055-2276504
	මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය මාන්කුලම් පාර,මුල්ලියාවෙලෙ, මුලතිව්. දු.ක. 021-2061012
	නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය නො. 116, කෝවිල් පාර, හාවාඑළිය, නුවරඑළිය. දු.ක. 052-2223702
	පොලොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය නො. 103, වාරිමාර්ග පෙදෙස, නවනගරය, පොළොන්නරුව. දු.ක. 027-3223023
	පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය මෝලවත්ත, මැදගම පාර, මාදම්පේ. දු.ක. 032-2248250
	රත්නපුර දිස්ත්‍රික් කාර්යාලය නො. 642, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර. දු.ක. 045-2228667
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කාර්යාලය නො.103/7, තැපැල් කාර්යාලය පාර, ත්‍රිකුණාමලය. දු.ක. 026-2226569
	වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය ඕල් පාර්ක් පාර, වවුනියාව. දු.ක. 024-2224679

පාලක මණ්ඩලය

2018 ජූනි සිට සැප්තැම්බර් දක්වා

1. වෛද්‍ය සාරංග අලහප්පෙරුම,
සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

2. ජගත් රාමනායක මහතා,
උප සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,
971, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

3. ජේ එම් සී එම්. ජයවර්ධන මැණිකේ මිය,
අධ්‍යක්ෂ ජනරාල්,
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
(2018 අගෝස්තු දක්වා)

4. ජේ.ඒ.ඩී.ජේ.ජයලත් මහතා,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.ආ.),
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.
(සැප්තැම්බර් පමණි)

5. පී.සී.පී.ජයතිලක මහතා,
අංක 304/1, පළමු මහල,
ශ්‍රවණාගාර ගොඩනැගිල්ල,
යූනියන් පෙදෙස, කොළඹ 02.

6. ඩී. අනුරාධා එල් ඉලේපෙරුම මිය,
අතිරේක ලේකම් (පරිපාලන),
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු,
354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

7. නාමල් වීරසේන මහතා,
අංක 1029 / ඩී, කොට්ටාව නැගෙනහිර,
පන්නිපිටිය.

8. රාහුල සේනානායක මහතා,
අංක 185/2, ලුම්බිණි පටුමග,
වේවැල්දූව, කැලණිය.

9. රෝහණ ගමගේ මහතා,
අංක 35 / බී, මාඛෝල, වත්තල.

10. පී.ඒ.කේ.ගුණවර්ධන මහතා,
අංක 44/1, හීනැටිකුඹුර පාර,
තලංගම (උතුර), බත්තරමුල්ල.

11. එස්.ඒ.උපාලි සෙනරත් පෙරේරා මහතා,
"සිරි ලක්", කොම්පිටිය පාර,
ගොඩකවෙල.

12. එම්.ඒ.වී.එන්.ආර්.විජේගුණවර්ධන මහතා,
අංක 31, රණවිරු සම්පත් මාවත,
පොල්හේන්ගොඩ, රත්නපුර.

13. එම්.පී.එන්.ප්‍රේමතිලක මිය,
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
මුදල් අමාත්‍යාංශය, ලේකම් කාර්යාලය,
කොළඹ 01.

2018 අප්‍රේල් දක්වා

1. ශෙහාන් සෙනෙවිරත්න මහතා,
සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.

2. වෛද්‍ය සාරංග අලහප්පෙරුම,
උප සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය. (2018 පෙබරවාරි දක්වා)

3. ප්‍රගත් රාමනායක මහතා,
උප සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය. (2018 මාර්තු සිට)

4. ජේ එම් සී එම්. ජයවර්ධන මැණිකේ මිය,
අධ්‍යක්ෂ ජනරාල්,
තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව,
354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05.

5. ආචාර්ය ඉෂාන්ත සිරිබද්දන,
අංක 18/2, බලපොකුණ පෙදෙස,
කොළඹ 06.

6. එම්. පී. ජයසේන මහතා,
"ශෂි", මහවත්ත පාර, හික්කඩුව.

7. නීතීඥ අශාන්ති වීරසිංහ,
අංක 33, දුටුගැමුණු මාවත,
දෙහිවල.

8. නීතීඥ දුමින්ද රාජපක්ෂ,
අංක 24, ලේනා බාම් වීදිය,
කොටුව, ගාල්ල.

9. ආර්.පී.කේ.ලියනගේ මහතා,
අංක 82/2, වක්වැල්ල පාර,
ගාල්ල.

10. සමන්ත රාජපක්ෂ මහතා,
අංක 56, 5 වන පටුමග,
නාවල.

11. ආර්.පී.කුකුලේවිතාන මහතා,
"නන්දන", අංක 86/6 ඒ,
සෙහේලි ගමගේ මාවත, කටුවාවල පාර,
මහරගම.

12. එච්. එල්. රෝහණ ජයසුන්දර මහතා,
අංක 195, හපුගල,
වක්වැල්ල, ගාල්ල.

13. නීතීඥ ඩබ්. එම්. කේ. එල්. වීරසිංහ,
අංක 286/7, ගැමුණු මාවත,
කොටුවෙගොඩ, රාජගිරිය.

14. ඩී. ඩී. කේ. රාජපක්ෂ මහතා,
අංක 11, චන්ද්‍රා වෙත්තසිංහ මාවත,
කොස්වත්ත, නාවල.

15. නාමල් වීරසේන මහතා,
අංක 1029 / ඩී, කොට්ටාව නැගෙනහිර,
පන්නිපිටිය.

16. ඊ.ඒ.කණිෂ්ක ප්‍රනාන්දු මහතා
අංක 53, පී.බී. අල්විස් පෙරේරා මාවත,
කටුබැද්ද, මොරටුව,

17. එම්.පී. එන්.ප්‍රේමතිලක මිය (නිරීක්ෂක),
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
මුදල් අමාත්‍යාංශය,
ලේකම් කාර්යාලය, කොළඹ 01.

අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන්...

1. ජේ.සී.කේ.බස්නායක මහතා	අධ්‍යක්ෂ ජනරාල් - වැ.ආ. (2018.10.05 දක්වා)
2. පී.ආර්. රොද්‍රිගෝ මහතා	අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
3. එන්.එස්.නිස්සංක මහත්මිය	අධ්‍යක්ෂ (පුහුණු)
4. එස්. ජයසිංහ මහතා	අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්)
5. පී.ඩබ්.ඩී.පී. සේනානායක මහතා	අධ්‍යක්ෂ (මුදල්)
6. ආර්.එම්.ඒ.පී. සමරදිවාකර මිය	අධ්‍යක්ෂ (තත්ත්ව)
7. ටී.පී.කේ. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (මානව සම්පත් හා තත්ත්ව කළමනාකරණ)
8. පී.එච්.වී.එන්.ඩබ්. ද සිල්වා මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ (පුහුණු)
9. සී.පී. සුබසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) හා (නඩත්තු හා සිවිල්)වැ.බ.
10. එස්.වී.පී. වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (ඇගයීම්)
11. ඒ.එච්.එස්.පී.විජේරත්න මහතා	සහකාර අධ්‍යක්ෂ (අධීක්ෂණ)
12. ඩබ්.ඒ.කේ.එස්. කුමාර මහතා	සහකාර අධ්‍යක්ෂ (කාර්යස්ථ පුහුණු) හා (පුහුණු)වැ.බ.
13. ඒ.ජේ. පතිරණ මහතා	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
14. එම්.එල්.පී. ප්‍රනාන්දු මහතා	සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශන හා අලෙවි)
15. ආර්.ඩබ්.එම්.ඒ.ජේ.රත්නායක මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ)
16. ටී.එස්.පී.ඒ.වික්‍රමසිංහ මහතා	සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
17. එන්.ඩී.පී.උස්ගොඩාරච්චි මහතා	සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා සැපයුම්)
18. යූ.එම්.ප්‍රොබෝෂිනී මිය	සහකාර අධ්‍යක්ෂ (මුදල්)
19. එන්.ඩබ්.එන්. සඳමාලි මිය	අභ්‍යන්තර විගණක
20. එම්.එච්. ශාජහන් මහතා	සහකාර අධ්‍යක්ෂ (පර්ෂද)
21. පී.පී. සුනිල් මහතා	සහකාර අධ්‍යක්ෂ (ජාතික නිපුණතා සම්මත)
22. ඩබ්.ඒ.පී. අල්විස් මිය	සහකාර අධ්‍යක්ෂ (සහතික)
23. පී.එම්.විතානගේ මිය	සහකාර අධ්‍යක්ෂ (පුහුණු සේවා)
24. ඩී.ආර්. සපුතන්ත්‍රී මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති - IET
25. පී.එම්. කුමාරසිංහ මිය	අධ්‍යක්ෂ/ විදුහල්පති - IETI
26. එච්.ඒ.එන්.ඩී. කුමාරි මිය	අධ්‍යක්ෂ/ විදුහල්පති - AETI
27. එස්. අර්වින් මහතා	අධ්‍යක්ෂ/ විදුහල්පති - SLGTI

දිස්ත්‍රික් කළමනාකරුවන්...

1.	ඒ. මසූර් මහතා	-	අම්පාර
2.	ඩී.ඩී. පියලත් මිය	-	කෑගල්ල
3.	එම්.ආර්.ඩී.ඒ.එස්.ගුණාරත්න මහතා	-	කළුතර
4.	එම්.ආර්.ඩී.ඒ.එස්.ගුණාරත්න මහතා	-	කොළඹ
5.	එස්.ඩී.අබේවික්‍රම මහතා	-	හම්බන්තොට
6.	වයි.එස්.පියතිලක මහතා (වැ.ආ.)	-	රත්නපුර
7.	පී.කේ.පී.ගුණවර්ධන මහතා	-	බදුල්ල
8.	ඒ.පී.ඩී.විජේරත්න මහතා (වැ.ආ.)	-	ගම්පහ
9.	පී. නාරන්ගොඩ මහතා	-	ගාල්ල
10.	බී.එම්.ජේ.එස්.කේ. රණාරාජා මහතා	-	මාතලේ
11.	කේ. කෘෂ්ණබාලන් මහතා	-	යාපනය
12.	එස්. පවලනාතන් මහතා	-	වව්නියාව
13.	යූ.එම්.කේ.නානායක්කාර මහතා	-	මාතර
14.	එස්.ඒ.එම්.එස්.එම්. සළිම් මවුලානා මහතා	-	මඩකලපුව
15.	එස්. වීනස් මහතා	-	මන්නාරම
16.	වයි.යෝකේස්වරන් මහතා (වැ.ආ.)	-	කිලිනොච්චි
17.	බී.ඒ.යූ.ඒ. කරුණාරත්න මහතා	-	මහනුවර
18.	ජේ. උදයවර්ධන මහතා (වැ.ආ.)	-	පුත්තලම
19.	එස්.පී.සී.ජේ. මෛත්‍රීදාස මහතා (වැ.ආ.)	-	මොනරාගල
20.	ඕ.කේ.පී.ඒ.සී.සමන් කුමාර මහතා (වැ.ආ.)	-	අනුරාධපුර
21.	යූ.පී.එන්.සමීර මහතා (වැ.ආ.)	-	පොලොන්නරුව
22.	එස්.සිවගෞරි මිය (වැ.ආ.)	-	මුලතිව්
23.	යූ.ඩී.එච්. ද සිල්වා මහතා (වැ.ආ.)	-	නුවරඑළිය
24.	කේ.පත්මනාදන් මහතා (වැ.ආ.)	-	ත්‍රිකුණාමලය
25.	ආර්.එම්.එන්.එස්.කේ.රත්නායක මහතා (වැ.ආ.)	-	කුරුණෑගල


National Apprentice & Industrial Training Authority
Organizational Structure
Chairman /CEO
Vice Chairman
Director General
Institutes /
Districts
Director Admin. & H.R.
Director Training
Director Quality
Director Planning & Monitoring
Director Finance
A.D. General Admin
A.D. Maint.& Constr.
A.D. HRM
A.D. HRD
A.D. Training Service
A.D. Training Admin
A.D. SIT
A.D. OJT
A.D. C.G.& Marketing
A.D. Quality
A.D. NSS
A.D. Assess ment
A.D. Certifi cate
A.D. Information Systems
A.D. Planning
A.D. Monito ring
A.D. Acc. & Controll
Internal Auditor
I.A.O
M.A.
Office Aide
VRU Officer
Trp. Officer
M.A.
Drivers
Tech. Officer
Drft.M. M.A.
A.O.
M.A.
M.A.
T.O.
Inspec
Q.A. Off.
D.B Adm
Sys. Adm
Stat. cian
Acct. Officer
Proc. Officer
Acct. Officer
B/ Sec Leg.Off
Book Keeper
Management Asst.
Office Aide

අධිකාරියේ අරමුණු

සංස්ථාපිත කිරීමේ පනතෙහි අංක 37 (1) දරන ඡේදය අනුව අධිකාරියේ පරමාර්ථ පහත පරිදි වේ.

(අ) වෘත්තීය පුහුණුව සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා ලබාදීම.

(ආ) වෘත්තීය පුහුණුවට අදාල පුහුණු සම්මතයන් නිශ්චය කිරීම.

(ඇ) වෘත්තීය පුහුණුවට අදාලව විභාග පැවැත්වීම හා සහතික පත්‍ර සහ වෙනත් ප්‍රධානයන් නිකුත් කිරීම.

(ඈ) ජාතික ශිල්පීය පරීක්ෂණය පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් කිරීම.

(ඊ) විවිධ දක්ෂතා වැඩිදියුණු කිරීම ප්‍රවර්ධනය පිණිස තරඟ පැවැත්වීම.

(උ) වෘත්තීය පුහුණුව සලස්වන ආයතනවල සහ වෙනත් ආයතනවල පුහුණු කිරීමේ හැකියාවන් සංවර්ධනය කිරීම.

(ඌ) වෘත්තීය පුහුණු කිරීම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු කොමිෂන් සභාවට උපදෙස් දීම.

(එ) සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි ආයතන සමඟ සම්බන්ධකම් ඇති සහතික, ඩිප්ලෝමා සහ උපාධි සමතත්වයෙහිලා සැලකීම සඳහා අදාල කටයුතු කිරීම සහ බලාත්මක කිරීම.

අධිකාරියේ ප්‍රධාන කාර්යයන් / වැඩසටහන්

(අ) රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධවී කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව ලබාදීම, පුහුණු ආයතන 04ක් සහ දිවයින පුරා පිහිටුවා ඇති ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථාන මඟින් ද්විත්ව පුහුණුව ලබාදීම.

(ආ) වෙනත් වෘත්තීය පුහුණුවන්නන් සඳහා විවිධ ආයතන වලට යොමුකොට කාර්යස්ථ පුහුණුව ලබාදීම.

(ඇ) මොරටුව, පේරාදෙණිය සහ රුහුණු විශ්ව විද්‍යාලයන්හී ඉංජිනේරු උපාධි අපේක්ෂක සහ අනෙකුත් ඩිප්ලෝමා හදාරන සිසුන් සඳහා අවශ්‍ය යන්ත්‍රාගාර පුහුණුව ලබාදීම.

(ඈ) අවිධිමත් ලෙස නිපුණතාව ලැබූ කර්මාන්ත ශිල්පීන්ට පෙර ඇගයීම් ක්‍රමයට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ලබාදීම, වෘත්තීයට අදාල පරිදි සුදුසුකම් සහතික ලබාදීම සහ අදාල ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම.

(ඉ) වෘත්තීය පුහුණු ආයතන වල පුහුණුකරුවන් පුහුණු කිරීම.

(ඊ) පාසල් සිසුන්, පාසල් හැරගිය සහ අනෙකුත් ඉලක්ක කණ්ඩායම් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම

පුහුණු ක්‍රමවේදය සහ අනෙකුත් ප්‍රධාන වැඩසටහන්

පුහුණු ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව, ආයතනික පුහුණුව/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව, යන්ත්‍රාගාර පුහුණුව, කාර්යස්ථ පුහුණුව ලෙස වර්ග කළ හැකිය.

● කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව

ආයතනය මගින් පවත්වාගෙන යනු ලබන පුහුණු කටයුතු අතර ප්‍රධාන පුහුණු ක්‍රමවේදය මෙය වන අතර, කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණු කිරීම් සඳහා අධිකාරිය ලත් ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය වේ. මෙම පුහුණු ක්‍රමවේදයේදී පුහුණු වන්නන් පුහුණු කාලය තුළ වැඩ කරමින් ඉගෙන ගැනීම මගින් අවශ්‍ය නිපුණතා ලබා ගන්නා අතර ඒ කර්මාන්ත සඳහා ඔහු හෝ ඇය අනුයුක්ත කරනු ලැබේ.

මෙහිදී පුහුණුලාභියා හට පහත ක්‍රමවේදයන් එකක් යටතේ පුහුණුව ලබා ගැනීමට හැකියාව ඇත.

i. කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව
ii. ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය
iii. ස්ථානානුරූපී ආධුනිකත්ව පුහුණුව
iv. ග්‍රාමීය ආධුනිකත්ව පුහුණුව

● කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව පුහුණුව

එක් එක් ක්ෂේත්‍රයට විශේෂිත වූ ජාතික පුහුණු හා කර්මාන්ත උපදේශක කමිටුව (NITAC) මගින් එක් එක් ක්ෂේත්‍රයන්ට පුහුණු සම්මතයන් පිළියෙලකොට එම පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණු කටයුතු සිදු කිරීමට කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් ආයතන වල ආධුනිකත්ව පුහුණුව ආරම්භ කළ හැකිය.

● ජාතික වෘත්තීය සුදුසුකම සහතික ක්‍රමය (NVQ)

ආධුනිකත්ව පුහුණුව යටතේ වෘත්තීන් 51ක් පදනම් කරගෙන 2016 වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. මෙම ක්‍රමයේ දී කර්මාන්ත ශිල්පී ආධුනිකත්ව ක්‍රමයෙන් කර්මාන්ත හිමියන් හා ආධුනිකයා අතර ගිවිසුමකට එළඹීමෙන් පසු එක් එක් පුහුණු ආයතනවල පුහුණුව ආරම්භ කළ හැකිය. මෙම ක්‍රමය තුල පුහුණු ආයතන /කර්මාන්ත තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම් සභාව යටතේ ප්‍රතිනතය කිරීමට සිදුකල යුතු අතර ආධුනිකයන් නිරන්තර ඇගයීමට ලක්කල යුතුය. පුහුණුව අවසානයේ දී තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී ඇති ඇගයීම් කරුවන් විසින් අවසාන ඇගයීම් පරීක්ෂණය සිදුකර ඒ ඒ මට්ටම සඳහා සහතික නිකුත් කරනු ලැබේ.

● ස්ථානුරූපී ආධුනිකත්ව පුහුණුව

මෙම පුහුණු ක්‍රමය යටතේ එක් එක් ප්‍රදේශයට ආවේණික වූ කර්මාන්තයෙහි පුහුණුව ලැබීමට ආධුනිකයින් යොමු කරන අතර අදාල පුහුණු සම්මතයන් අදාල ආයතනය හා අධිකාරිය සමඟ එක්ව පිළියෙල කරනු ලබයි.



● ග්‍රාමීය මට්ටමේ ආධුනිකත්ව පුහුණුව

කර්මාන්ත ශිල්පීය මට්ටමේ වෘත්තීන් සඳහා සකස් කරන ලද පුහුණු සම්මතයන්ට අනුකූලව පුහුණුව ලබාදිය නොහැකි ආධුනිකයන් හට ග්‍රාමීය පුහුණු පහසුකම් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය මට්ටමේ සිටින පුහුණුලාභීන් හට පුහුණුව ලබාදීම ඉලක්ක කොට ග්‍රාමීය ආධුනිකත්ව පුහුණු ක්‍රමය හඳුන්වා දී ඇත. මේ සඳහා අවශ්‍ය කරන පුහුණු සම්මත එම ආයතනය සමඟ සාකච්ඡා කොට අධිකාරිය මඟින් පිළියෙල කරනු ලැබේ.

කර්මාන්ත පාදක කර්මාන්ත ශිල්පී ආධුනිකයන්ට සහ ජාතික වෘත්තීය සුදුසුකම සහතික ලාභීන්ට අදාල න්‍යායික දැනුම පුහුණුව මඟින් සහ දුරස්ථ අධ්‍යාපනය මඟින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

තවද ආධුනිකයන් හට අවශ්‍ය මූලික න්‍යායික හා ප්‍රායෝගික දැනුම යම් කාල පරිච්ඡේදයකදී අදාල පුහුණු මධ්‍යස්ථානයක් මඟින් ලබා දෙන අතර තවදුරටත් ඔවුන්ට විෂය කරුණු ස්වයං අධ්‍යයනය සඳහා පහසුකම් සලසා දෙමින් මුද්‍රිත තැපැල් මාර්ගික පාඩම් මාලා මොඩියුලද අධිකාරිය මඟින් ලබා දෙනු ලැබේ. පාඩම්මාලා අවසානයේ ඇති ප්‍රශ්නාවලියට ආධුනිකයින් පිළිතුරු ලියා එවනු ලැබීමෙන් පසුව අදාල නිවැරදි කිරීම් කොට නැවත ඔවුන් වෙත තැපැල් මඟින් යවනු ලැබේ.

මුද්‍රිත පාඩම්මාලා හැදෑරීමේදී පුහුණුවන්නන් මුහුණදෙන ගැටළු හා අපහසුතා නිරාකරණය කිරීමට කාලීනව සති අන්ත පන්ති අධිකාරිය විසින් සංවිධානය කරනු ලැබේ.

මීට අමතරව වෘත්තීයට අදාල ඉංග්‍රීසි දැනුම දියුණු කර ගැනීම සඳහා ඉංග්‍රීසි පාඩම්මාලා ද මෙම ආධුනිකයන් වෙත ලබා දෙනු ලැබේ.

● ආයතනික පුහුණු/ මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව

මෙම ක්‍රමය යටතේ ආධුනිකයින් සෘජුවම ජාතික පුහුණු ආයතනයකට හෝ ප්‍රාදේශීය පුහුණු ආයතනයකට නියමිත කාලපරිච්ඡේදයකට අනුයුක්ත කර බඳවා ගනු ලබන අතර ඉන්පසුව පුද්ගලික හෝ රජයේ ආයතනයක කාර්යස්ථ පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. පුහුණු ආයතන හෝ පුහුණු මධ්‍යස්ථාන මඟින් අදාල න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදෙනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධිකාරිය යටතේ ජාතික ආයතන හතරට (04)ට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශ වල

පුහුණු මධ්‍යස්ථාන 74ක් පවත්වාගෙන යන ලදී. මේවායේ පවත්වන ලද පාඨමාලාවල කාලය මාස 06 සිට අවුරුදු 04 දක්වා වෙනස් වේ.



● යන්ත්‍රාගාර පුහුණුව

1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 38 (සී) වගන්තියට අනුව මොරටුව, පේරාදෙණිය හා රුහුණු විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයින්ගේ ඉංජිනේරු උපාධි සඳහා ද විශ්ව විද්‍යාල සහ අනෙකුත් තෘතීය අධ්‍යාපන ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ඩිප්ලෝමා පාඨමාලා සඳහා ද අදාල යන්ත්‍රාගාර පුහුණුව අධිකාරිය මගින් ලබාදෙනු ලැබේ.

● කාර්යස්ථ පුහුණුව

අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන වල ආයතනික පුහුණුව සම්පූර්ණ කරන්නන් සඳහා හය මාසයක කාර්යස්ථ පුහුණුව අධිකාරිය මගින් සපයනු ලබයි. විශේෂයෙන් කාර්මික විශ්ව විද්‍යාල, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, ජාතික තරුණ සේවා සභාව සහ අනෙකුත් පිළිගත් රජයේ / පෞද්ගලික ආයතන වල වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුව ලැබුවන්ට කාර්මික අංශයේ ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා දීම සඳහා මෙම පුහුණුව ආරම්භ කොට ඇත.

කර්මාන්ත ශිල්පී ආධුනිකයින් සහ ජාතික ආධුනිකත්ව සහතික ක්‍රමය යටතේ පුහුණුව අවසන් කළ ආධුනිකයන් සඳහා අවසාන වෘත්තීය පරීක්ෂණය ප්‍රධාන කාර්යාලයේ ඇගයීම් අංශයෙන් පවත්වනු ලැබේ. එසේ වුවද පර්ෂද කාර්යාල පිහිටු වීමත් සමඟ මෙම කටයුතු විමධ්‍යගත කිරීමට අපේක්ෂා කරන බැවින් දැනට තුන් වන පර්ෂද යටතට ගැනෙන කොළඹ, ගම්පහ සහ රත්නපුර දිස්ත්‍රික්ක වල පමණක් එම පර්ෂද කාර්යාල මගින් අවසාන වෘත්තීය පරීක්ෂණය සිදුකරනු ලැබේ.

මීට අමතරව ජාතික වෘත්තීය සුදුසුකම් පරීක්ෂණය (NVQ) සහ ජාතික වෘත්තීය පරීක්ෂණ (NTT) සම්බන්ධ ඇගයීම් ද ප්‍රධාන කාර්යාලය මගින් සිදුකරයි.

ස්ථානානුරූපී සහ ග්‍රාමීය මට්ටමේ ආධුනිකයන් සඳහා වූ අවසාන වෘත්තීය පරීක්ෂණය අදාල දිස්ත්‍රික් කාර්යාලය විසින් පවත්වනු ලැබේ.

ජාතික ආයතනයන්හි සියලුම සහතිකපත් අධ්‍යක්ෂ විදුහල්පති හෝ ලේඛකාධිකාරී සමඟ අධිකාරියේ සභාපතිතුමාගේ අත්සනින් යුතුව එම ආයතන මඟින් නිකුත් කරනු ලැබේ.



● ජාතික වෘත්තීය පරීක්ෂණ හා ජාතික වෘත්තීය සුදුසුකම

මෙම වැඩසටහන මඟින් වෘත්තීය පරීක්ෂණ පවත්වා අදාල නිපුණතා ඇති ශිල්පීන් හට ප්‍රවීණතා සහතික නිකුත් කිරීම සිදුකරයි. අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මෙම ක්‍රමය වඩාත් භාවිත කරයි.

දැනට පවතින වෘත්තීය පරීක්ෂණ III ශ්‍රේණිය, II ශ්‍රේණිය සහ I ශ්‍රේණිය ලෙස අර්ධ නිපුණ, නිපුණ, විශිෂ්ට නිපුණ ලෙස මට්ටම් 3 කින් පැවැත්වේ.

ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය ජාතික නිපුණතා සම්මත නොමැති වෘත්තීන් 10 කට සහ ශ්‍රී ලංකා පරිගණක නිපුණතා සහතිකය නිකුත් කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබයි.

ජාතික වෘත්තීය පරීක්ෂණ ක්‍රමය වර්තමානයේ දී ජාතික වෘත්තීය සුදුසුකම් සහතික ක්‍රමය (NVQ) යටතේ පවතින පෙර ඉගෙනුම් පසු ඇගයීම (RPL) බවට පරිවර්තනය වෙමින් පවති.

මේ සඳහා අවිධිමත් පුහුණුව ලැබූ දැනට සේවා කරන නිපුණ ශිල්පීන්ට පිළිගත් වෘත්තීය සහතිකයක් ලබා ගැනීම මඟින් වඩා හොඳ දේශීය හා විදේශීය රැකියාවන් ලබා ගැනීම සඳහා මඟ පාදා දෙනු ලබයි.

● ජාතික නිපුණතා සම්මත සංවර්ධන

අධිකාරිය මඟින් වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයට අදාලව ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වේ. ජාතික නිපුණතා සම්මත පිළියෙල කිරීමේ නීතිමය බලය පනත මඟින්ම අධිකාරිය වෙත පැවරී ඇත.

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගන්නා වෘත්තීන් සඳහා අදාල ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සහ වලංගු ගතකිරීම මේ යටතේ සිදු කෙරේ.

ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුවක් මඟින් සකස් කරනු ලබන ජාතික නිපුණතා සම්මත

එක් එක් වෘත්තීන්ට අදාල සංවර්ධන කමිටුවක් මගින් සංවර්ධනය කිරීම සහ පුනරීක්ෂණය කිරීම මෙහිදී සිදු කෙරේ.

ජාතික කාර්මික පුහුණු උපදේශක කමිටුව එක් එක් ක්ෂේත්‍රයට සහ වෘත්තීන්ට විශේෂිත වූ පුද්ගලයින්ගෙන් සැලසුම්ලත් කමිටුවක් වන අතර මේ වන විට උපදේශක කමිටු 28 ක් පමණ හඳුනාගෙන ඇත. මෙම එක් එක් කමිටුවකට සාමාජිකයන් 16 දෙනෙකු පමණ ඇතුළත් වේ.

● ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන

පුහුණුවේ යෙදී සිටින සහ පුහුණුව අවසන් කළ යන කොටස් දෙක සඳහාම මෙම වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහි ප්‍රධාන ඉලක්කය පුහුණුව අවසන්කළ පසු ස්වයංරැකියා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාව ලබා දීම වේ.

● වෘත්තීය මාර්ගෝපදේශනය

පාසල් හැරගිය සහ පාසල් යන සිසුන්ගේ වෘත්තීය පුහුණුව පිළිබඳව සහ විශේෂයෙන් රැකියා වෙළඳපොළ පිළිබඳ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.



● කාර්ය මණ්ඩල සංවර්ධනය සහ පෞර්ෂත්ව සංවර්ධනය

නයිටා ආයතනයේ සේවකයින්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන් විවිධ අදියර යටතේ සිදුකරනු ලබන අතර ඔවුන්ගේ රැකියා වැඩකටයුතු වලට සිදුවන බාධාවන් අවම වන පරිදි පවත්වාගෙන යනු ලැබේ.

දත්ත නිරූපණය

2018		බඳවා ගැනීම		පුහුණුව භැරයෑම		පුහුණුව සම්පූර්ණ කිරීම		පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව	
		2017	2018	2017	2018	2017	2018	2017	2018
මධ්‍යස්ථාන| පාදක ආධුනිකත්ව පුහුණුව	දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - පූර්ණ කාලීන - වෙනත්	1,411	1,511	217	461	944	1,185	1,207	1,072
	දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - පූර්ණ කාලීන - ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	4,005	4,128	597	774	2,997	3,390	3,576	3,540
	දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - අර්ධ කාලීන	820	799	-	14	417	918	573	440
ජාතික ආයතන	පූර්ණ කාලීන	1,137	1,688	327	231	691	1,095	3,388	3,750
	අර්ධ කාලීන	873	769	25	31	479	641	503	600
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	කම්කරු ශිල්පී	6,223	4,617	2,525	3,377	3,824	2,976	8,488	6,752
	ජාතික වෘත්තීය සුදුසුකම (NVQ)	15,205	17,886	3,212	3,706	11,201	10,582	7,974	11,572
	ස්ථානානුරූපී	2,368	1,362	855	616	2,052	1,583	1,704	867
	ග්‍රාමීය මට්ටම	676	418	141	104	397	622	569	261
උප එකතුව		**32,718**	**33,178**	**7,899**	**9,314**	**23,002**	**22,992**	**27,982**	**28,854**
වෙනත්	විශේෂ කම්කරු පුහුණුව	9,573	8,994	701	245	10,442	7,119	4,419	6,049
	රැකියාස්ථ පුහුණුව	8,052	8,749	826	982	8,166	7,807	3,450	3,410
එකතුව		**50,343**	**50,921**	**9,426**	**10,541**	**41,610**	**37,918**	**35,851**	**38,313**

වගුව 01 - පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශය (විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ)

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂ වල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

සමස්තයක් ලෙස 2018 වසර සැලකීමේදී 50,921ක් ආධුනිකයින් බඳවා ගනිමින් පෙර වසර සමඟ සැසඳීමේදී 1%ක වර්ධනයක් නිරූපණය කරයි. (වගුව 01) මධ්‍යස්ථාන ආධුනිකත්ව පුහුණුවට සාපේක්ෂව කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති බව මෙම වසර තුළ ද කැපී පෙනෙන ලක්ෂණයක් වේ. වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුළ කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව සිදු කරනු ලබන එකම ආයතනය අප ආයතනය වීම මෙයට හේතුවක් වනු ඇත.

2017 වසර සමඟ සැසඳීමේදී ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සඳහා ආධුනිකයින්ගේ වැඩි නැඹුරුවක් දක්නට ලැබේ. ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) සඳහා බඳවා ගැනීම පෙර වසර සමඟ සැසඳීමේදී 16% වර්ධනයක් නිරූපණය කරයි.

පෙර වසර සමඟ සැසඳීමේදී පුහුණුව හැරයාම 10% වර්ධනයක් පෙන්නුම් කරයි. (විශේෂ කර්මාන්ත පුහුණුව හා රැකියාස්ථ පුහුණුව හැර)

මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුවෙහි පෙර වසර සමඟ සැසඳීමේදී පුහුණුව හැරයාම 52% වර්ධනයක් නිරූපණය කරන අතර ජාතික ආයතන තුළ පුහුණුව හැරයාම මඳක් අඩුවී ඇත. මේ සඳහා ප්‍රධාන හේතුව ලෙස පුහුණු මධ්‍යස්ථාන තුළ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීම හා මධ්‍යස්ථානය තුළ පවතින සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීම හා ඒවා නිසිපරිදි නඩත්තු නොකිරීම දැක්විය හැක.

කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුවෙහි පෙර වසර සමඟ සැසඳීමේදී පුහුණුව හැරයාම 16% ක වර්ධනයක් නිරූපණය කරයි.



ප්‍රස්ථාරය 01 - පුහුණු කිරීමේ කාර්යයන්හි සාරාංශය (වසර 14ක් තුළ)

ආධුනිකයින් බඳවා ගැනීම, ආධුනිකයින් පුහුණුව හැරයාම සහ ආධුනිකයින් පුහුණුව සම්පූර්ණ කිරීම පෙර වසර 14 සමඟ සැසඳීම මෙමඟින් සිදු කෙරේ. (ප්‍රස්තාරය 01)

ආධුනිකයින් බඳවා ගැනීම ධනාත්මක ප්‍රවණතානයක් නිරූපණය කරයි. ආධුනිකයින් පුහුණුව හැරයාම සාමාන්‍ය මට්ටමක් නිරූපණය කරයි. ආධුනිකයින් පුහුණුව සම්පූර්ණ කිරීම ද ධනාත්මක ප්‍රවණතාවයක් නිරූපණය කරයි.



ප්‍රස්ථාරය 02 - විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ පුහුණුවට බඳවා ගැනීම

සමාලෝචිත වර්ෂයේ විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ ආධුනිකයින් පුහුණුවට බඳවා ගැනීම ඉහත ප්‍රස්ථාරය 02 මඟින් නිරූපණය කරයි. කර්මාන්ත පාදක ආධුනිකත්ව සඳහා ආධුනිකයින්ගේ වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන බව මෙම ප්‍රස්ථාරය මඟින් මනාව පිළිබිඹු වෙයි.

වගුව 02 - විවිධ වර්ගීකරණයන් යටතේ පුහුණු කිරීමේ සාරාංශය (ස්ත්‍රී පුරුෂ භාවය අනුව)

2018			බඳවාගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
			පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
මධ්‍යස්ථාන පාදක ආධුනිකත්ව පුහුණුව	දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - පූර්ණ කාලීන	ජාතික වෘත්තීය සුදුසුකම් නොවන	438	1,073	1,511	133	328	461	276	909	1,185	307	765	1,072
		ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)	1,593	2,535	4,128	316	458	774	1,378	2,012	3,390	1,208	2,332	3,540
	දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන - අධර් කාලීන		203	596	799	3	11	14	234	684	918	101	339	440
ජාතික ආයතන	පූර්ණ කාලීන		1,405	283	1,688	198	33	231	936	159	1,095	3,148	602	3,750
	අධර් කාලීන		707	62	769	31	-	31	617	24	641	557	43	600
කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව	කම්කරුන්ත ශිල්පී		2,848	1,769	4,617	2,712	665	3,377	1,551	1,425	2,976	5,045	1,707	6,752
	ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)		12,722	5,164	17,886	2,491	1,215	3,706	8,394	2,188	10,582	7,045	4,527	11,572
	ස්ථානානුරූපී		835	527	1,362	325	291	616	878	705	1,583	539	328	867
	ග්‍රාමීය මට්ටම		147	271	418	33	71	104	183	439	622	104	157	261
උප එකතුව			**20,898**	**12,280**	**33,178**	**6,242**	**3,072**	**9,314**	**14,447**	**8,545**	**22,992**	**18,054**	**10,800**	**28,854**
වෙනත්	විශේෂ කම්කරුන්ත පුහුණුව		5,436	3,558	8,994	148	97	245	4,325	2,794	7,119	3,706	2,343	6,049
	රැකියාස්ථ පුහුණුව		3,848	4,901	8,749	432	550	982	3,074	4,733	7,807	1,279	2,131	3,410
එකතුව			**30,182**	**20,739**	**50,921**	**6,822**	**3,719**	**10,541**	**21,846**	**16,072**	**37,918**	**23,039**	**15,274**	**38,313**

***පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂ වල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

ඉහත වගුව අංක 02 මඟින් විවිධ පුහුණු වර්ගීකරණයන් යටතේ පුහුණු කිරීමේ සාරාංශය ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිරූපණය කරයි. සමස්තයක් ලෙස ගත් කළ පුරුෂ පාර්ශවය පාඨමාලා සඳහා වැඩි නැඹුරුවක් නිරූපණය කරන බව පෙන්නුම් කරයි.

මධ්‍යස්ථානපාදක පුහුණුව සැලකීමේදී කාන්තා පාර්ශවය වැඩි නැඹුරුවීමේ ප්‍රතිශතයක් නිරූපණය කරයි. මක්නිසාදයත් මධ්‍යස්ථාන පාදක පුහුණු පරිසරය කාන්තාවන්ට හිතකර බැවිනි. කර්මාන්ත පාදක ආධුනිකත්ව පුහුණුව හා ජාතික ආයතන ආධුනිකත්ව පුහුණුව සලකා බැලීමේදී පුරුෂ පාර්ශවය වැඩි නැඹුරු වීමේ ප්‍රතිශතයක් පෙන්නුම් කරයි. මක්නිසාදයත් එම පුහුණු කිරීමෙහි පවතින පාඨමාලා බහුතරය තාක්ෂණික පාඨමාලා වන බැවිනි.

සමාලෝචිත වර්ෂය තුළ ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණුව සඳහා බඳවා ගැනීම පහත ප්‍රස්තාරය 03 මඟින් මනාව පිළිබිඹු වේ.



ප්‍රස්ථාරය 03 - ස්ත්‍රී පුරුෂ භාවය අනුව පුහුණු කිරීම් සඳහා බඳවා ගැනීම (විශේෂ කර්මාන්ත පුහුණුව හා රැකියාස්ථ පුහුණුව හැර)

සමාලෝචිත වර්ෂය තුලදී පුහුණුව සඳහා යොමු කරන ලද ආධුනිකයන්ගෙන් 63% පුරුෂ පාර්ශවය වන අතර 37%ක් ස්ත්‍රී පාර්ශවය නියෝජනය කරයි. (ප්‍රස්තාරය 03)

වගුව 03 - පුහුණු කිරීමේ සාරාංශය (දිස්ත්‍රික් සහ අනෙකුත් පුහුණු වර්ගීකරණය යටතේ)

දිස්ත්‍රික්කය	ඉලක්ක	බඳවාගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	3,096	2,174	1,660	3,834	822	340	1,162	1,582	1,316	2,898	2,411	1,459	3,870
ගම්පහ	1,286	906	340	1,246	363	85	448	445	249	694	997	350	1,347
කළුතර	1,284	502	556	1,058	348	158	506	280	304	584	425	439	864
නුවර	1,543	564	424	988	220	151	371	305	321	626	506	381	887
මාතලේ	669	336	196	532	115	79	194	273	137	410	213	170	383
නුවරඑළිය	936	270	482	752	92	107	199	204	486	690	190	347	537
ගාල්ල	1,432	934	729	1,663	459	165	624	570	389	959	819	675	1,494
මාතර	1,565	714	697	1,411	263	211	474	422	523	945	607	596	1,203
හම්බන්තොට	940	1,353	476	1,829	169	157	326	1,083	359	1,442	347	408	755
යාපනය	1,081	579	461	1,040	156	120	276	531	271	802	615	592	1,207
මන්නාරම	440	407	201	608	96	18	114	345	256	601	352	192	544
වවුනියාව	670	800	395	1,195	107	65	172	596	352	948	295	208	503
මුලතිව්	298	553	298	851	77	29	106	474	150	624	214	222	436
කිලිනොච්චි	778	358	217	575	92	18	110	330	302	632	359	149	508
මඩකලපුව	1,063	1,079	301	1,380	708	30	738	672	168	840	1,429	287	1,716
අම්පාර	911	981	378	1,359	340	94	434	516	214	730	800	252	1,052
ත්‍රිකුණාමලය	992	866	488	1,354	164	65	229	619	270	889	772	453	1,225
කුරුණෑගල	1,346	1,002	570	1,572	257	178	435	592	398	990	546	477	1,023
පුත්තලම	720	423	414	837	78	104	182	289	289	578	295	333	628
අනුරාධපුරය	741	998	382	1,380	235	101	336	708	260	968	411	322	733
පොළොන්නරුව	1,071	1,039	249	1,288	175	128	303	871	149	1,020	421	165	586
බදුල්ල	959	384	502	886	208	203	411	213	296	509	242	428	670
මොණරාගල	692	437	299	736	143	133	276	333	159	492	208	235	443
රත්නපුරය	1,154	592	717	1,309	177	184	361	387	406	793	481	615	1,096
කෑගල්ල	987	535	503	1,038	149	116	265	270	352	622	394	400	794
උප එකතුව	**26,654**	**18,786**	**11,935**	**30,721**	**6,013**	**3,039**	**9,052**	**12,910**	**8,376**	**21,286**	**14,349**	**10,155**	**24,504**
ජාතික ආයතන පූර්ණ කාලීන	1,783	1,405	283	1,688	198	33	231	936	159	1,095	3,148	602	3,750
ජාතික ආයතන අර්ධ කාලීන	1,118	707	62	769	31	-	31	617	24	641	557	43	600
එකතුව	**29,555**	**20,898**	**12,280**	**33,178**	**6,242**	**3,072**	**9,314**	**14,463**	**8,559**	**23,022**	**18,054**	**10,800**	**28,854**
විශේෂ කම්කරු පුහුණුව	9,775	5,436	3,558	8,994	148	97	245	4,325	2,794	7,119	3,706	2,343	6,049
රැකියාස්ථ පුහුණුව	11,000	3,848	4,901	8,749	432	550	982	3,074	4,733	7,807	1,279	2,131	3,410
මුළු එකතුව	**50,330**	**30,182**	**20,739**	**50,921**	**6,822**	**3,719**	**10,541**	**21,862**	**16,086**	**37,948**	**23,039**	**15,274**	**38,313**

*** පුහුණුව සම්පූර්ණ කිරීම් සහ පුහුණුව හැරයාම තුළ පෙර වර්ෂ වල බඳවාගත් ආධුනිකයින්ද ඇත.

සමස්තයක් ලෙස ගත් කළ වැඩිම ආධුනිකයින් පිරිසක් බඳවා ගනිමින් කොළඹ දිස්ත්‍රික්කය ඉදිරියෙන්ම සිටින අතර අඩුම ආධුනිකයින් පිරිසක් බඳවාගත් දිස්ත්‍රික්කය ලෙස මාතලේ දිස්ත්‍රික්කය පෙන්නුම් කරයි.



ප්‍රස්ථාරය 04 - ජාතික ආධුනිකත්ව පුහුණුව (අර්ධකාලීන ආධුනිකත්ව පුහුණුව හැර)

2018 වර්ෂය සැලකිමේදී ජාතික වෘත්තීය සුදුසුකම සහ අනෙකුත් පුහුණු කිරීම් යටතේ ආධුනිකයින් බඳවා ගැනීම ප්‍රස්තාරය 04 මඟින් නිරූපණය වේ. සමස්තයක් ලෙස ගත්කළ ජාතික වෘත්තීය සුදුසුකම සඳහා වැඩි නැඹුරුවක් දක්වන බව ඉහත ප්‍රස්තාරය මඟින් නිරූපණය වේ. ජාතික ආයතන මඟින් පවත්වනු ලබන සෑම පාඨමාලාවක්ම ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා වේ.

වගුව 04 - මධ්‍යස්ථාන පාදක ද්විත්ව පුහුණුව පූර්ණ කාලීන දිස්ත්‍රික් මට්ටමින් (ජාතික ආයතන හැර)

දිස්ත්‍රික්කය	බඳවාගැනීම්			පුහුණුව හැරයාම්			පුහුණුව සම්පූර්ණ කිරීම්			පුහුණුවේ රැඳී සිටින සංඛ්‍යාව		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
කොළඹ	205	509	714	91	100	191	172	448	620	241	450	691
ගම්පහ	4	73	77	2	15	17	8	62	70	5	104	109
කළුතර	63	162	225	26	32	58	36	114	150	63	151	214
නුවර	97	159	256	22	18	40	81	105	186	91	147	238
මාතලේ	19	90	109	3	28	31	14	82	96	19	78	97
නුවරඑළිය	35	374	409	26	75	101	44	328	372	34	257	291
ගාල්ල	80	131	211	59	10	69	86	93	179	79	127	206
මාතර	147	136	283	2	32	34	151	119	270	51	127	178
හම්බන්තොට	100	132	232	31	37	68	60	91	151	57	104	161
යාපනය	40	85	125	4	7	11	33	65	98	38	80	118
මන්නාරම		90	90		11	11		139	139	-	82	82
වවුනියාව	21	68	89	7	15	22	30	49	79	17	58	75
මුලතිව්			-			-			-			-
කිලිනොච්චි	91	47	138	11	13	24	92	67	159	126	45	171
මඩකලපුව	23	18	41	4	3	7	19	27	46	20	15	35
අම්පාර	47	185	232	17	35	52	9	140	149	30	74	104
ත්‍රිකුණාමලය	158	184	342	16	30	46	81	124	205	149	133	282
කුරුණෑගල	134	198	332	53	39	92	76	146	222	101	188	289
පුත්තලම	31	128	159	4	35	39	24	101	125	29	116	145
අනුරාධපුරය	24	140	164	4	32	36	14	118	132	21	128	149
පොළොන්නරුව	557	53	610		2	2	505	45	550	221	49	270
2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2018 Rs.		2018 Rs.	
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපල,යන්ත්‍ර සහ උපකරණ	2	1,146,799,844.30		1,133,224,552.48	
ප්‍රාග්ධන වැඩ ප්‍රගතිය	3	119,219,554.62	1,266,019,042.92	81,177,888.77	1,214,402,441.25
ජංගම වත්කම්					
තොග	4	13,328,148.78		10,793,964.87	
ලැබිය යුතු දේ	5	112,096,415.14		96,972,271.25	
තැන්පත්,පූවර් ගෙවීම් හා අත්තිකාරම්	6	41,615,714.32		11,646,294.06	
කෙටිකාලීන ආයෝජන	7	76,622,153.57		113,003,558.76	
මාගර්ස්ථ මුදල්	8	1,233,548.73		132,776.24	
මුදල් සහ මුදල් සමාන	9	67,437,644.69	312,333,625.23	37,501,960.58	270,050,825.76
			1,578,352,668.15		**1,484,453,267.01**
මුළු වත්කම්					
සාමාන්‍ය කොටස්					
සමුච්චිත අතිරික්තය	11	(832,388,817.12)		-887,348,543.26	
සමුච්චිත අතිරික්තය අධර් කාලීන	11a	39,693,917.31		71,582,600.30	
සංචිත	11b	741,584,069.35		743,984,018.30	
රජයේ ප්‍රදාන-ප්‍රාග්ධන	11c	71,249,441.66		56,180,987.46	
රජයේ ප්‍රදාන -SSDP	11d	45,645,417.94		25,411,785.59	
විලම්බිත ආදායම	13	1,141,710,286.15	1,207,494,315.29	1,095,807,919.85	1,105,618,768.24
ජංගම නොවන වගකීම්					
පාරිතෝෂික ප්‍රතිපාදන	12	175,094,677.00	175,094,677.00	192,986,573.00	192,986,573.00
ජංගම වගකීම්					
ගෙවිය යුතු	10	195,763,675.86	195,763,675.86	185,847,925.77	185,847,925.77
			1,578,352,668.15		**1,484,453,267.01**
මුළු කොටස් හා වගකීම්					

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක7 සිට 14 දක්වා සටහන් සහ මෙම මූල්‍ය ප්‍රකාශනවල අන්තගර්ත කොටසකි.

සහතික කිරීම

2018 දෙසැම්බර් 31න් අවසන්වන වෂර්ය සඳහා සිදු කළ කටයුතු පිළිබඳ සැබෑ හා සාධාරණ දෘෂ්ටියක් ඉහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශනයයෙන් ලබා දෙන බව අපි සහතික කරමු.

.....	.....	.....
කේ.ඒ.ඩී.තමරා රණ්‍යලතා	**නසීර් අහමඩ්(ඉංජිනේරු)**	**යූ.එම්.ප්‍රබෝෂිණි**
ගිණුම් නිළධාරි	**සභාපති/ප්‍රධාන විධායක නිළධාරි**	**සහකාර අධ්‍යක්ෂ- (මූල්‍ය සහ පාලන)**

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය හා බැඳේ.
මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත් අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය

වර්ෂ අවසානය සඳහා		31.12.2018	31.12.2017
විස්තර	**සටහන්**	**Rs.**	**Rs.**
මෙහෙයුම් ආදායම්			
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		1,175,060,000.00	904,645,000.00
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන පුනරුත්ථාපනය		15,508,938.42	11,307,195.02
ස්වයං උත්පාදක ආදායම්	11a	(31,681,454.63)	14,285,491.43
මාරුකල විලම්බිත ආදායම්	13	101,120,861.86	89,419,133.58
වෙනත් ආදායම්			
ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන		89,220,153.36	78,083,202.94
වෙනත් ආධාර	14	36,292,796.69	13,570,489.55
ඕස්ට්‍රේලියානු ව්‍යාපෘතිය		4,624,950.00	
ලං.වි.ම හා නයිටා ඒකාබද්ධ ව්‍යාපෘතිය		8,970,277.00	
වෙනත් ආදායම්	15	61,824,449.06	60,476,913.53
මුළු ආදායම		**1,460,940,971.76**	**1,171,787,426.05**
මෙහෙයුම් වියදම්			
පුහුණු ද්‍රව්‍ය	16	22,204,257.82	16,918,529.17
වෙනත් පුහුණු වියදම්	17	218,985,857.71	187,743,531.91
කායර් මණ්ඩල වියදම්- පෞද්ගලික වේතන	18	717,152,571.58	656,944,973.00
කායර් මණ්ඩල වියදම්-වෙනත්	19	21,395,464.01	58,268,125.19
ප්‍රවාහන හා සන්නිවේදන	20	87,903,661.26	67,098,741.90
සැපයුම් සහ කායර්ාල අවශ්‍යතා	21	45,364,037.79	27,311,194.71
උපකරණ නඩත්තුව	22	11,290,870.25	13,075,316.09
පරිශ්‍ර නඩත්තුව	23	181,343,941.59	153,400,307.42
මූල්‍ය හා වෙනත් වියදම්	24	4,514,455.19	4,758,212.55
ක්ෂයවීම්	25	133,318,578.63	128,772,709.34
විගණන ගාස්තු		584,004.61	552,680.19
සම්පූර්ණ මෙහෙයුම් වියදම්		**1,444,057,700.44**	**1,314,844,321.47**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල අතිරික්තය (හිඟය)		**16,887,271.32**	**(143,056,895.42)**
අතිරික්ත/හිඟ පිළිබඳ සමුච්චිත ප්‍රකාශය			
<u>නයිටා අරමුදල</u>			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දින සිට		(870,562,966.04)	
ගණනය කරන ලද අතිරික්තය/(හිඟය) ස්වයංක්‍රීයව සිදු කළ		(240,823.10)	
පෙර වර්ෂයේ ගැළපීම්		(16,785,577.22)	
පෙර වර්ෂයේ ගැළපීම් වසර තුළ		6,344,494.30	
පෙර වර්ෂයේ ගැළපීම් නයිටා අරමුදල් විවෘත ශේෂය		287,328.99	
<u>අර්ධ කාලීන</u>			
කලින් වාර්තා කරන ලද පරිදි ජනවාරි 1 වන දින සිට අධර් කාලීන		71,582,600.30	
පෙර වර්ෂයේ ගැළපීම්		45,763.16	
වර්ෂයේ ගැළපීම්		(252,991.52)	
ජනවාරි 1 වන දින සිට නැවත ආරම්භ කරන ලද		(809,582,171.13)	(727,506,070.62)
කාල සීමාව සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		16,887,271.32	(143,056,895.42)
දෙසැම්බර් 31 සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)		**(792,694,899.81)**	**(870,562,966.04)**

3

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

අවසන්වන වර්ෂය සඳහා	31.12.2016		31.12.2015	
	Rs		RS	
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
වෂර්ය සඳහා අතිරික්තය(හිඟය)		16,887,271.29		(143,056,895.42)
ගැලපීම්				
ක්ෂයවීම්	133,589,815.05		129,228,543.34	
විලම්බිත ආදායම්	(101,120,861.86)		(4,501,717.49)	
වත්කම් බැහැර කිරීමේ පාඩුව	219.89		_	
බොල් ණය AETI PU/PTC සහ ATI PU/PTC	16,069.82		_	
පෙර වෂී ගැලපුම නයිටා ගිණුමේ ලාභය	(1,201,220.99)		_	
පෙර වෂීයේ ගැලපීම් අධර්කාලීන මෝටර් රථ ඉංජිනේරු අභ්‍ය	207,228.36		_	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	3,049,641.80		45,730,977.00	
පාරිතෝෂික ගෙවීම්	(13,774,173.80)		(19,998,091.50)	
තොග වැඩිවීම/අඩු වීම	(2,534,183.91)		1,574,703.74	
අය විය යුතු දේ අඩු/වැඩි වීම්	(15,124,143.89)		11,042,490.42	
තැන්පතු, කලින් ගෙවීම් සහ අත්තිකාරම්වල අඩු/වැඩි වීම්	(29,969,420.26)		5,051,840.97	
කෙටිකාලීන ආයෝජන අඩු /වැඩි වීම්	36,381,405.19		_	
ගෙවිය යුතු දේ අඩු/වැඩි වීම්	5,367,615.52		60,072,392.88	
ආදායම් ප්‍රකාශයට මාරු කළ ප්‍රාග්ධන ප්‍රදාන	4,548,134.57		16,010,840.84	
ක්ෂය ගැළපීම්	_		109,324.97	
ආදායම් ප්‍රකාශයට මාරු කළ ප්‍රාග්ධන ප්‍රදාන	_		(89,419,133.58)	
රජයේ ප්‍රදාන පැවරීම්	_		(11,307,195.02)	
අවිනිශ්චිත ගිණුම		19,436,125.49	(3,072,105.20)	138,952,906.10
මෙහෙයුම් ක්‍රියාකාරකම් නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		36,323,396.78		(4,103,989.32)
ආයෝජන කටයුතු				
උපකරණ මිලදී ගැනීම	(147,376,559.00)		(121,150,476.42)	
ප්‍රාග්ධන ප්‍රගතියේ කායර්යන්	(38,041,665.85)		(11,710,672.16)	
ස්ථාවර වත්කම් විකිණීම්වලින් ඉදිරියට	4,146.25		2,800.00	
ස්ථාවර වත්කම් අතිරේකයන් ගැළපීම්			(303,855.38)	
ආයෝජන කටයුතු නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		(185,414,078.60)		(133,162,203.96)
මූල්‍ය කටයුතු				
රජයේ ප්‍රදාන ප්‍රාග්ධන	126,777,061.58		78,800,000.00	
SSDP ප්‍රාග්ධන	30,890,888.95			
ලද ආධාර	24,657,364.19			
කමර්ාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ මායිම් බිත්ති අරමුද	(2,198,176.30)			
ආයෝජන කටයුතු නිසා උත්පාදිත ශුද්ධ මුදල් ප්‍රවාහය		180,127,138.42		78,800,000.00
මුදල් හා මුදල් වලට සමාන ශුද්ධ වැඩිවීම්		31,036,456.60		(58,466,193.28)
කාලය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන		37,634,736.82		209,104,488.86
කාලය අවසානයේදී මුදල් හා මුදල් සමාන		**68,671,193.42**		**150,638,295.58**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා ශුද්ධ වත්කම් වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

විස්තරය	සමුච්චිත අරමුදල	රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	SSDP ප්‍රාග්ධන	විලම්බිත ආදායම් ප්‍රදාන (වගකීම්)	ලද ආධාර	අර්ධකාලීන ගිණුම්වල ලාභය	පුස්තකාල අරමුදල	යකුරු පැදි වළල්ල අරමුදල	IETI තාප්පය සඳහා අරමුදල	අර්ධ කාලීන ප්‍රාග්ධන සංචිත	අර්ධ කාලීන අනිවාර්යය සංචිත	බුදු මැදුර අරමුදල	MYASD ප්‍රදාන	එකතුව
2017 දෙසැම්බර් **31** දිනට ශේෂය	(870,275,637.05)	0.00		1,095,807,919.84	717,117,964.73	71,582,600.30	93,730.75	7,415,059.28	2,306,218.20	11,148,914.78	5,902,130.56	719,866.84	63,800,000.00	1,105,618,768.23
ප්‍රාග්ධන ප්‍රදාන විවෘත ශේෂය නයිට්ා අරමුදලේ සිට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම වෙත මාරු කිරීම	(81,592,773.05)	56,180,987.46	25,411,785.59											0.00
බුදුමැදුර සහ MYDS ප්‍රදාන	64,519,866.84											(719,866.84)	(63,800,000.00)	0.00
සමුච්චිත ලාභය	(240,823.10)													(240,823.10)
2018 ජනවාරි මස 1 වන දිනට ශේෂය	**(887,589,366.36)**	**56,180,987.46**	**25,411,785.59**	**1,095,807,919.84**	**717,117,964.73**	**71,582,600.30**	**93,730.75**	**7,415,059.28**	**2,306,218.20**	**11,148,914.78**	**5,902,130.56**	**0.00**	**0.00**	**1,105,377,945.13**
පෙර වර්ෂ ගැලපුම	287,328.99					45,763.16								333,092.15
වගකීම් ගිණුම වෙත මාරු කළ පුස්තකාල අරමුදල							(93,730.75)							(93,730.75)
විවෘත ශේෂය නැවත ආරම්භ වූ	**(887,302,037.37)**	**56,180,987.46**	**25,411,785.59**	**1,095,807,919.84**	**717,117,964.73**	**71,628,363.46**		**7,415,059.28**	**2,306,218.20**	**11,148,914.78**	**5,902,130.56**	_	_	**1,105,617,306.53**
GOSL වසර සඳහා ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන		142,286,000.00	30,890,888.95											173,176,888.95
ප්‍රාග්ධන පුනරුත්ථාපන		-15,508,938.42												-15,508,938.42
වසරේ ලාභය	48,568,725.95					(31,681,454.63)								16,887,271.32
වෂීය සඳහා ගැලපීම්	6,344,494.30					(252,991.52)								6,091,502.78
අර්ධකාලීනව ලැබූ ආධාර					24,657,364.19									24,657,364.19
විවිධ වගකීම්වලට මාරු කළ		-111,708,607.38	(10,657,256.60)	147,023,228.17	(24,657,364.19)									0.00
විලම්බිත ආදායමට මාරු කළ				(101,120,861.86)										(101,120,861.86)
තාප්පය ඉදිකිරීමේ අරමුදල මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය									(2,293,247.22)					(2,293,247.22)
තාප්පය ඉදිකිරීමේ අරමුදලේ ශේෂය මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය									(12,970.98)					(12,970.98)
වෙනත් ණය හිමියන් වෙත මාරු කරන ලද තාප්පය ඉදිකිරීමේ අරමුදල මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය														
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**(832,388,817.12)**	**71,249,441.66**	**45,645,417.94**	**1,141,710,286.15**	**717,117,964.73**	**39,693,917.31**	**0.00**	**7,415,059.28**	**(0.00)**	**11,148,914.78**	**5,902,130.56**	**0.00**	**0.00**	**1,207,494,315.29**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

1. පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. වාර්තා කිරීමේ ආයතනය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත කොට ඇති ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය (මින් ඉදිරියට ආයතනය ලෙස සඳහන් කෙර) අංක 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

2. සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත සහ පිළිගත් ගිණුම්කරණ මුල ධර්ම මත ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කර ඇත.

මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත සකස් කෙරේ. මුල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් සටහන් කොට ඇත.

3. සංසන්දනාත්මක තොරතුරු

3.1 පසුගිය වර්ෂයට අදාල අගයන් අදාල වසරේ ඉදිරිපත් කිරීම් සමඟ අදාල වන පරිදි ගලපා ඇත.

4. රජයේ ප්‍රදාන සහ ආධාර

4.1. සංවිධානයේ වියදම් රජයේ ප්‍රදාන මත රඳා පවතින එම ප්‍රදාන ලැබීම් ලෙස ගිණුම්ගත කර ඇත. පුනරාවර්ථන වියදම් සඳහා අදාල රජයේ ප්‍රධාන විස්තරාත්මක ආදායම් ප්‍රකාශයට බැර කර ඇති අතර ප්‍රාග්ධන වියදම් සඳහා ලැබීම් ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අරමුදලට බැර කර ඇත.

4.2 වත්කම් මාරු කිරීම් ලෙස ලැබෙන රජයේ ප්‍රදානයන් විලම්භීත ආදායම් ලෙස සලකා ඒවායේ ආයුකාලය අනුව ගිණුම් ගත කර ඇත.

5. වත්කම් සහ තක්සේරු කිරීම් පදනම

5.1 තොග

තොග සාමාන්‍යයෙන් පිරිවැය මත තක්සේරු කරනු ලැබේ. යල් පැන ගිය මුද්‍රිත ද්‍රව්‍ය තොග සඳහා 5%ක වෙන් කිරීමක් කර ඇත.

5.2 ලැබිය යුතු

අයවිය යුතු ප්‍රමාණයන් එපරිද්දෙන් දක්වා ඇති අතර 2015.12.31 දින වන විට

අධිකාරියේ සේවය නොකරන සේවකයින් ගේ අඩමාන සහ බොල් ණය සඳහා 100% ප්‍රතිපාදන ලබා දී ඇත. කුසලතා සංවර්ධන ආංශික ව්‍යාපෘතිය සහ සේවයේ නොමැති කාර්ය මණ්ඩලය හැර අනෙකුත් සියලුම ණයකරුවන් සඳහා 5% ප්‍රතිපාදන බොල් සහ අඩමාන ණය ලෙස ලබා දී ඇත.

5.3 දේපල,යන්ත්‍ර සහ උපකරණ

(අ) පිළිගැනීම සහ මිනුම්

දේපල,යන්ත්‍ර සහ උපකරණ සමුච්චිත ක්ෂය වීම හෝ අපහායන අලාභ වියදම් අඩු ආකාරයෙන් දක්වා ඇත.

(ආ) පිරිවැය

දේපල,පිරියත හා උපකරණවල පිරිවැය තුළ ඒවා මිලදී ගැනීම් සහ වැඩදායී තත්වයට ගෙන ඒම සඳහා දැරූ සෘජු පිරිවැය ද අන්තර්ගත වේ.

අධිකාරියේ කාර්යසාධනය පවත්වාගෙන යාම හෝ වැඩිදියුණු කිරීම සඳහා ස්ථීර වත්කම් අත්පත් කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

(ඇ) භාණ්ඩ ලේඛනය - කෙටි කාලීන

ප්‍රාග්ධනය කරගත නොහැකි කෙටි කාලීන භාණ්ඩ අයිතම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට කපා හැර ඇත.කෙසේ වෙතත්, මෙම අයිතම පාලනය කිරීමේ අරමුණින් ලේඛනගත කර ඇති අතර භෞතික වශයෙන් ද පාලනය සිදු කෙරේ.

(ඈ) ක්ෂය වීම්

ක්ෂයවීම ගණනය කරනු ලබන්නේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත සරල රේඛීය පදනමකිනි.

ක්ෂය වීම් අනුපාතය

බදු සමඟ පවතින ඉඩම්	කල් බදු කාලය තුළ
ගොඩනැගිලි	5%
යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	10%
ගෘහ භාණ්ඩ,සවිකුරු සහ කාර්යාලීය උපකරණ	10%
පරිඝනක සහ උපාංග	25%
පුස්තකාල පොත්	10%
මෝටර් රථ	25%

5.4මුදල් හා මුදල් සමාන

අතැති මුදල්, බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මුදල් හා මුදල් සමාන ලෙස අර්ථ දැක්විය හැක.

අතැති මුදල් සහ බැංකු තැන්පතු, කෙටි කාලීන ආයෝජන, මාර්ගස්ථ මුදල්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී මුදල් හා මුදල් සමාන ලෙස සැලකේ.

6. වගකීම් සහ ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ දිනට ඇති සියලුම වගකීම් මුදල් ප්‍රකාශයට ඇතුළත් කර ඇති අතර දැනටමත් පවතිනවා යැයි සැලකෙන වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී ඇති නමුත් ඒවායේ වටිනාකම නිවැරදිව ගණනය කළ නොහැක. ඉල්ලුම මත සිදුකළ යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත සිදු කළ යුතු ගෙවීම්, මූල්‍ය ප්‍රකාශයේ වර්තමාන වගකීම් ලෙස සැලකේ.ශේෂ පත්‍රයේ දින සිට වසරකට පසුව සිදුකළ යුතු ගෙවීම් වත්මන්-නොවන වගකීම් ලෙස මුදල් ප්‍රකාශයේ සැලකේ.

6.1 පාරිතෝෂිත ප්‍රතිපාදන

සියළුම සේවකයින්ට ආරම්භක වර්ෂයේ සිට ගෙවිය යුතු පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරණ ප්‍රතිපාදන පනතට සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 16වන වගන්තියට අනුව සේවකයෙකු කෙරෙහි මෙම වගකීම බල පැවැත්වෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කළ විටය. employee arises on completion of five years of continued services.

6.2 නිශ්චිත දායක සැලසුම්

එනිශ්චිත දායකත්ව සැලසුම් සඳහා ගෙවිය යුතු දායක මුදල්,වියදම් ලෙස ආදායම් ප්‍රකාශයේදී සැලකේ. අධිකාරිය සේවක අර්ථසාධක අරමුදලට (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 15% සහ 3% ට නොඅඩු මුදලකින් දායක වේ.

7. ආදායම

රජයෙන් ලද ආධාර, පුනරාවර්තන වියදම් ලෙස ලද දේශීය හා විදේශීය ආධාර සහ අධිකාරියේ විවිධ ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට බැර කර ඇත. ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ප්‍රධාන අලුත්වැඩියාවන් සහ ප්‍රාග්ධන වත්කම් වැඩිවීම් සඳහා වියදම් කළ මුදල් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ප්‍රාග්ධනිත කර නොමැති අතර සමාන මුදලක් ප්‍රාග්ධන ප්‍රදානවලින් මාරු කර ඇත.

ස්ථාවර වත්කම්වල හඳුනාගත් වගකීම් සහ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ලැබීමෙන් පසු අතිරික්තය/හිඟය හෝ වියදමට වඩා වැඩි ආදායම ඇති විය.

අධිකාරිය ක්‍රියාත්මක කිරීමේදී සහ එහි ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාමේදී සිදුවන වියදම් අයභාරගත කර ඇත

8. ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම්

සියළු ද්‍රව්‍යමය ප්‍රාග්ධන කැපවීම් සහ අවිනිශ්චිත වගකීම් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය වෙනස් කිරීම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලැබේ.

9. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවීම්

"ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවන්හිදී ගිණුම් තුළ අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත."

10. විලම්භිත ආදායම් අඩුවීම්/වැඩිවීම් මුදල් නොවන සංචලනයන් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. VTY/E/NAITA/01/18/20 මෙම අංකය உமது இல. Your No. දිනය திகதி Date 2020 සැප්තැම්බර් 14 දින

සභාපති

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම් කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 අභිතකර මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුල බදු ඉඩම් සඳහා රු.452,458ක් ක්‍රමක්ෂය ලෙස ගිණුම්ගත කර තිබුණද, එම ඉඩම් ක්‍රමක්ෂය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ අයිතම සෑම වර්ෂ 3 කට හෝ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පිරිවැය රු.3,406,430,802 ක්වූ දේපල පිරියත උපකරණ අධිකාරිය ආරම්භයේ සිටම ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රු. 118,901,800 ක්වූ මෝටර් වාහන සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවියයුතු දායකය හා අධිභාර ලෙස ගෙවිය යුතු එකතුව රු.173,453,298 ක් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 22 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණු අතර කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු කථිකාචාර්යවරයෙකු සේවයෙන් ඉවත් කිරීමට අදාලව ගෙවීමට සිදු වී තිබුණු රු.3,875,000 ක වන්දි මුදල් සම්බන්ධයෙන් 34 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 12 ට අනුව කල්බදු දේපල මූල්‍ය ප්‍රකාශනවල සින්නක්කර දේපලවලින් වෙන්කර දැක්විය යුතු වුවත් අධිකාරිය විසින් දීර්ඝ කාලීන බදු පදනම මත මිලදීගෙන තිබුණු රු.72,600,542 ක් වටිනා බදු ඉඩම්, ඉඩම් යටතේ දක්වා තිබුණි.

(උ) අධිකාරියේ අරමුදල් වලින් සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු වටිනාකම රු. 26,172,364 ක් වූ දේපල පිරියත හා උපකරණ දෝෂ සහගත ලෙස රාජ්‍ය ප්‍රදාන ලෙස සලකා ක්‍රමක්ෂය කිරීම හේතුවෙන් වර්ෂයට අදාල විලම්භීත ආදායම රු. 6,164,341 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පුහුණු මධ්‍යස්ථාන 7 කට අදාලව සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ රු.1,529,672 ක් බදුකුලී වියදම අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම 2019 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද රු.200,000 ක බදු කුලිය ඉදිරියට කල ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) 2017 වර්ෂයට අදාළව 2018 වර්ෂයේදී ගෙවන ලද රු. 949,587 ක්වූ විවිධ වියදම් හා රු. 872,506ක් වූ වාර ප්‍රවේශ පත්‍ර ගාස්තු ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත තර තිබුණි.

(ඒ) ඔරුගොඩවත්ත කාර්මික ඉංජිනේරු අභ්‍යාස ආයතනය පවත්වාගෙන ගිය තක්සේරු වටිනාකම රු. 181,000,000 ක් වූ හෙක්ටයාර් 1.5951 ක ඉඩම් කොටසක් හා පොත් අගය රු.305,486,464 ක්වූ ගොඩනැගිලිවලින් කොටසක් 2015 වර්ෂයේදී කැලණි පාලම් ව්‍යාපෘතියට පවරාගෙන තිබුණ ද එම ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම් හඳුනාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. එසේම පවරා දුන් ඉඩම වෙනුවට 2015 වර්ෂයේදී අධිකාරියට ලබාදී තිබුණු පොත් අගය රු. 202,278,159 ක්වූ ඉඩම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද ඉවත් කල ගොඩනැගිලි වෙනුවට රු.1,539,821,351 ක් වැය කර ඉහත ව්‍යාපෘතියෙන් ඉදිකර 2017 වර්ෂයේ දී අධිකාරිය වෙත භාරදී තිබුණු සහ දැනට භාවිතා කරනු ලබන ගොඩනැගිලි වල වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ඔරුගොඩවත්ත මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය ඉදිකිරීමේදී බදු පදනම මත ලබාගෙන තිබුණු ඉඩමෙන් තක්සේරු වටිනාකම රු.231,000,000 ක කොටසක් 2016 වර්ෂයේදී පරමාණු බලශක්ති අධිකාරියට පවරා තිබූ අතර ඒ වෙනුවට තක්සේරු වටිනාකම රු.119,000,000 ක්වූ ඉඩමක් හල්බරාව ප්‍රදේශයෙන් ලැබී තිබුණි. එය 2017 පෙබරවාරි 02 සිට

භුක්ති විඳිනු ලැබුවද එම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීමට හා ඉවත්කල ඉඩමේ වටිනාකම ගිණුම්වල ගැලපීමට කටයුතුකර නොතිබුණි.

(ඕ) එකතු වටිනාකම රු. 630,642,234 ක් වූ ජපන් හා බටහිර ජර්මන් ආධාර යටතේ වර්ෂ ගණනාවකට පෙර ඉදිකර තිබුණු ඔරුගොඩවත්ත හා කටුබැද්ද ඉංජිනේරු අභ්‍යාස ආයතනවල ගොඩනැගිලි වාර්ෂිකව ක්ෂය කර තිබුණ ද ක්‍රමානුකූල පදනමක් යටතේ විලම්භිත ආදායම් ලෙස හඳුනාගැනීමකින් තොරව සංචිත යටතේ දක්වා තිබුණි.

(ක) ඔරුගොඩවත්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය ප්‍රතිස්ථාපනය කිරීමේදී පොළොවට සවිකර තිබුණු උපකරණ විනාශවීම හේතුවෙන් ඒ වෙනුවට 2017 වර්ෂයේදී කැළණි පාලම් ව්‍යාපෘතියෙන් ලද රු.44,628,721 ක් වටිනා උපකරණ ගිණුම්ගත කිරීමට හා විනාශ වූ උපකරණවල වටිනාකම හඳුනාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ග) 2016 වර්ෂයේදී ආධුනිකයන් පුහුණු කිරීම වෙනුවෙන් රාජ්‍ය ආයතනයකින් ලැබුණු රු. 8,812,500ක් අදාල කාර්යයන් වෙනුවෙන් වැයකර තිබිය දී එම මුදල් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව තවදුරටත් තැන්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ච) සමාලෝචිත වර්ෂයට අදාලව, පාරිතෝෂික වෙන්කිරීම් ගණනය කිරීමේදී වැරදි ගණනය කිරීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වෙන්කිරීම් හා සමුච්චිත වෙන්කිරීම් රු.30,014,189 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සේවයෙන් විශ්‍රාම ගෙන තිබුණු නිලධාරීන් හතරදෙනෙකු වෙනුවෙන් ගෙවියයුතු රු.2,206,047 ක පාරිතෝෂික මුදල්, වර්ෂය තුළදී ණය පදනම මත ලබාගෙන තිබුණු රු.428,500 ක ප්‍රාග්ධන උපකරණ හා කෙරිගෙන යන වැඩ යටතේ ගෙවියයුතු රු.1,912,854 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ට) 2018 දෙසැම්බර් 31 දිනට පුහුණු පාරිභෝගික ද්‍රව්‍ය හා දෛනික වාර්තා පොත් අවසන් තොගය පිළිවෙලින් රු.12,370,230 ක් හා රු. 2,268,602 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඩ) අධිකාරියේ උපකාර්යාල 2017 වර්ෂයට අදාල රු. 9,583,231ක් වූ උපචිත වියදම් අධිවෙන් කිරීම වෙනුවෙන් ගැලපීම් සිදු කර නොතිබීම හේතුවෙන් ජංගම බැරකම් වැඩියෙන් දක්වා තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන

පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරියේ පවත්වාගෙන ගොස් නොතිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව 1.2 හි ඇතුළත් (ඇ) ඡේදය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සමාජිකයෙකුට අධිකාරියට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සමානාත්මතා ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති /විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 115 (4) වගන්තිය	පූර්ව මුදල් වර්ෂයට කලින් වූ මුදල් වර්ෂයකට අදාල සෑම හිමිකම් පෑමක් සඳහාම ගෙවීම් කිරීමට පෙර ප්‍රධාන ගණුන් දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එයට පටහැනිව 2016 හා 2017 වර්ෂවලට අදාල රු.567,000 ක බදුකුලී සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.
(ii) මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 371 (2) ඡේදය	කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත් 2017 වර්ෂයට පෙර සිට පවතින නොපියවූ අත්තිකාරම් ශේෂය රු. 5,031,401 ක් විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුල අදාල නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

  (අ) අධිකාරියේ පවිත්‍රතා කටයුතු සඳහා සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ලැබී තිබුණු ලංසු අතරින් අවම මිල සහිත ලංසුකරු සමඟ සාකච්ඡා කර කොන්දේසි පිළිබඳව එකඟතාවයකට පැමිණීමේ හැකියාව තිබියදී එය නොසලකා දෙවන අවම මිල සහිත ලංසුකරු වෙත යොමුවීම හේතුවෙන් වර්ෂයකට රු.5,065,860 ක පමණ මූල්‍ය අලාභයක් සිදුවන බව නිරීක්ෂණය විය.

  (ආ) කිලිනොච්චිය ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ ශ්‍රී ලංකා ජර්මාණු කාර්මික ආයතනයේ 2018/2019 පවිත්‍රතා සේවාව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව අධිකාරියේ ආරක්ෂිත සේවා කටයුතු වල නිරත

පෞද්ගලික ආයතනයේ කළමනාකරණය යටතේ පවතින වෙනත් ආයතනයකට ලබාදී රු. 7,155,761 ක් ගෙවීම් කර තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) වසර ගණනාවකට පෙර අර්ධකාලීන පුහුණු පාඨමාලා ආදායම්වලින් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබුණු රු. 33,911,384 ක් එම පාඨමාලා වැඩිදියුණු කිරීම් සඳහා යොදා ගැනීම් වෙනුවට අධිකාරියේ විවිධ අංශ වෙත බෙදා හැරීම සඳහා පරිගණක 300 ක් මිලදී ගැනීම වෙනුවෙන් වැය කර තිබුණි.

(ආ) ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබූ ශිෂ්‍ය සුභසාධක හා පාඨමාලා වැඩිදියුණු කිරීමට අදාල රු. 1,515,000 ක් හා අර්ධකාලීන පාඨමාලාවට අයත් රු.3,088,910 ක් ආපසු ලබාගෙන අධිකාරියේ ප්‍රයෝජනය සඳහා ප්‍රාග්ධන අයිතම මිලදී ගැනීම වෙනුවෙන් වැය කර තිබුණි.

(ඇ) ගිවිසුම් මත බඳවාගත් කථිකාචාර්යවරයෙකුගේ සේවය නවතා දැමීමට එරෙහිව ඔහු විසින් පවරා තිබූ නඩුවේ තීන්දුව අනුව එම කථිකාචාර්යවරයාගේ සේවා කාලය දීර්ඝ කිරීමේදී සේවා බණ්ඩනය කිරීමකින් තොරව සේවා ගිවිසුම් වලට එලඹ තිබීම හේතුවෙන් අධිකාරියට රු. 3,875,000 ක වන්දි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 71 රෙගුලාසියේ දක්වා ඇති විධිවිධානයන්ට පටහැනිව හා 2017 අප්‍රේල් 07 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත බඳවාගැනීම් පටිපාටියේ ඇතුලත් නොවූ ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුර ලෙස නව තනතුරු නාමයක් ඇති කර නිලධාරීන් 04 දෙනෙකු බඳවාගෙන 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා රු. 1,350,119 ක් නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘති අරමුදල් මඟින් ගෙවීම් කර තිබුණි.

(ඉ) මූලික ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමකින් තොරව ඉංජිනේරු තාක්ෂණ ආයතනයක් ස්ථාපිත කිරීම සඳහා වසා දමන ලද පාසලක ගොඩනැගිලි 2018 වර්ෂයේදී රු. 8,185,249 ක් වැය කර නවීකරණය කර තිබුණි. එම ගොඩනැගිලි භාවිතයකින් තොරව අත්හැර දමා තිබූ බව 2019 ජූලි 19 දින සිදුකල භෞතික විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ඊ) කටුබැද්ද කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ ආධුනිකයන් විසින් නිෂ්පාදනය කරනු ලබන ලීබඩු අලෙවි කිරීමේ අරමුණින් 2014 හා 2016 කාලපරිච්ඡේදය තුල රු. 18,847,771 ක් වැයකර ආයතන භූමියේ ප්‍රදර්ශනාගාරයක් ඉදිකර තිබුණද එම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ගොඩනැගිල්ල 2020 ජනවාරි මාසය දක්වාම භාවිතයකින් තොරව නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(උ) 2018 නොවැම්බර් 18 දින පෞද්ගලික දුරකථන ආයතනයක් විසින් අධිකාරිය වෙත Huawei වර්ගයේ Tab පරිගණක 450 ක් පරිත්‍යාග කර තිබුණු අතර එයින් රු. 1,626,400 ක් වටිනා Tab පරිඝණක 16 ක් 2019 ඔක්තෝබර් 15 දින දක්වාම නිකුත් කිරීමකින් තොරව ප්‍රධාන ගබඩාවේ තබා තිබුණි.

(ඌ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 2.14.1 වගන්තිය හා 2017 මාර්තු 15 දිනැති අතිරේක 33 අනුව දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව යටතේ විවෘත තරඟකාරී ප්‍රසම්පාදන පටිපාටි අනුගමනය කලයුතු රු. 50,211,231 ක මිලදී ගැනීම් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4.2 ඡේදයට පටහැනි ලෙස ප්‍රසම්පාදනයන් කොටස් කරමින් (Slicing) මිල සැදැහුම් ක්‍රමයේ පටිපාටි අනුගමනය කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව - පිළිතුරු

01. අ) 2020 වර්ෂයේ සිට ගිණුම්කරණ ප්‍රතිපත්තිමය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත.

ආ) 2020 වර්ෂයේදී වාහන ප්‍රත්‍යාගණනය කර ඇත. අනෙකුත් වත්කම් 2020 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයේදී ප්‍රත්‍යාගණනය කරන අතර, ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තු මඟින් සිදු කිරීමට කටයුතු යොදා ඇත.

ඇ) මේ වන විට අධිකාරියට අයත් වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර ප්‍රත්‍යාගණිත වටිනාකම් 2020 අවසාන ගිණුම් වල ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇත.

ඈ) එකඟවේ. අධිකාරියට එරෙහි නඩු සම්බන්ධව සටහන් අංක 30 මඟින් දක්වා ඇත. එම නඩු තීන්දුව ලැබී ඇත්තේ 2019 මැයි 02 වන බැවින් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන දැක්වීමට නොහැකි විය. 2019 වර්ෂයේ අවසන් ගිණුම් සටහන් මඟින් සේවක අර්ථ සාධක හා සේවක භාරකාර අරමුදල් ප්‍රතිපාදන දක්වා ඇත. 2020 දෙසැම්බර් මාසය වන විට සේවක භාරකාර අරමුදල සියළු ගෙවීම් සිදුකර ඇති අතර, සේවක අර්ථසාධක අරමුදලෙහි සේවා යෝජක මුදලින් කොටසක් ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

ඉ) 2019 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

උ) 2019 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

ඌ) මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට බලාපොරොත්තු වන අතර අදාල නීති රීතීන්ට අනුකූලව කටයුතු කරන බව දන්වමි.

එ) 2019 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

ඒ) 2019 වසරේ දී ගිණුම් ගත කර ඇත. ඉවත් කළ කොටස සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් වටිනාකම් ඉල්ලුම්කර ඇති අතර, එය ලැබුණු පසු තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු වටිනාකම ලබා ගැනීමෙන් අනතුරුව 2020 වර්ෂයේ ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.

ඔ) 2015 වර්ෂයේ කැලණි පාලම් ව්‍යාපෘතිය ඉඩම් ගොඩනැගිලි පවරා ගැනීම සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා 2020.07.07 දිනැතිව ලිපියක් යොමු කර ඇති අතර, ඒ අනුව 2020 අවසාන ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කරනු ඇත.

ඕ) 2019 වර්ෂයේදී කොටසක් නිවැරදි කර ඇත. කටුබැද්ද ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ 126,669,016.51ක් හා ඔරුගොඩවත්ත මෝටර්රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ 470,496,549.47ක් 2019 වර්ෂයේ දී විලම්භිත ආදායම් ලෙස ගිණුම්ගත කර ඇත.

ක) 2019 වර්ෂයේ දී ගිණුම්ගත කර ඇත.

ග) මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරනු ඇත.

ච) එකඟවෙමි. 2019 වර්ෂයේදී ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

ජ) එකඟ වෙමි. මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරනු ඇත.

ට) ටැලි පැකේජයේ ශේෂ පිරික්සුමේ ආරම්භක තොගය ලෙස පෙන්නුවත් පරීක්ෂා කිරීමේ දී අවසාන තොගය තුළ අන්තර්ගතය.

ඩ) මෙවැනි වැරදි ඉදිරියට සිදු නොවිමට කටයුතු කර ඇත.

02. අ) ලංසු කැඳවීමේ කොන්දේසි වල සඳහන් ප්‍රධාන කොන්දේසි උල්ලංඝනය කිරීම හේතුවෙන් හා අවම ලංසුව ඉදිරිපත් කර තිබූ ලංසුකරු විසින් අපගේ සේවා ගිවිසුමෙහි වගන්ති 4 ක් සඳහා එකඟවිය නොහැකි බවට ලිඛිතව දන්වා ඇති බැවින්, ඒ පිළිබඳව එම ආයතනයේ නියෝජිතයින් සමඟ සාකච්ඡා කරන ලදී. එහෙත් ඔවුන්ට එම කොන්දේසි සඳහා එකඟ විය නොහැකි බව දන්වා ඇත. ප්‍රධාන කොන්දේසි සපුරා නොමැති ටෙන්ඩර්කරුවකු සමඟ සාකච්ඡා කිරීම නීත්‍යානුකූල නොවන බැවින් දෙවන ඉල්ලුම්කරු තෝරා ගැනීමට සිදුවිය.

ආ) මෙම අවස්ථාව වන විට ප්‍රධාන කාර්යාලය ඇතුළුව ජාතික ආයතන 3 හි පවිත්‍රතා සේවාව පවත්වාගෙන යනු ලැබූ සැපයුම්කරු වෙතින් කිලිනොච්චිය SLGTI පවිත්‍රතා සේවාව සපයා ගැනීම සම්බන්ධයෙන් මිල ගණන් ලබා ගැනීමේදී එම මිල මසකට රු.881,911.77 ක් වූ අතර, ඒ වන විට ආයතනයේ ආරක්ෂක සේවාව සපයනු ලැබූ **ඩෙල්ව් ගාඩ් සිකියුරිටි සර්විස් ආයතනයට අනුබද්ධ ඩෙල්ව් ගාඩ් මෑන් පවර් සර්විස් ආයතනය** ඔවුන්ගේ පවිත්‍රතා සේවාව සඳහා මාස 01 ක් වෙනුවෙන් අය කරන මුදල රු.381,500 කි. ඒ අනුව නව ආයතනයකට පවිත්‍රතා සේවා කටයුතු පැවරුවහොත් මාස 01 ක් සඳහා රු.500,411.77 ක මූල්‍ය අලාභයක් සිදුවනු ඇත. මෙම කරුණු සැලකිල්ලට ගෙන කිලිනොච්චිය SLGTI ආයතනයේ පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යාමේ කොන්ත්‍රාත්තුව ඩෙල්විගාර්ඩ් මෑන් පවර් සර්විස් ආයතනය වෙත පවරා දීමට කටයුතු කර ඇත.

03. අ) ඒකාබද්ධ අරමුදලින් ලැබෙන මුදල් ප්‍රමාණවත් නොවන බැවින් අධිකාරියේ ශිෂ්‍ය සුභසාධනය සඳහා පිහිටුවා ඇති අරමුදල සඳහා වූ පනත ප්‍රකාරව පාලක මණ්ඩල අනුමැතියට අනුව එම පරිගණක මිල දී ගෙන ඇති අතර ඉන් බහුතර ප්‍රමාණය ශිෂ්‍යයන් අතර හා ඉතිරිය අංශ අතර බෙදා දීමට කටයුතු කර ඇත.

ආ) ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ව්‍යවස්ථාපිත අරමුණු ප්‍රකාරව ශිෂ්‍යයන් සඳහා අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය යටතේ රු. 1,515,000 ක මුදල යොදවා ඇත.

ඇ) කටුනායක, ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ නාවික ඉංජිනේරු අංශයට 2009.11.01 දින සිට 2019.11.03 දින දක්වා කොන්ත්‍රාත් පදනමින් සේවා ගිවිසුමකට යටත්ව මෙම කථිකාචාර්යවරයා බඳවාගෙන ඇත. එහිදී 2016.11.04 දින සිට 2019.11.03 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා සේවා ඛණ්ඩනයක් සහිතව සේවා ගිවිසුමක් ලබා දී තිබුණි.

සේවා ඛණ්ඩනය සමඟ සේවා ගිවිසුම් වලට එළඹීම කම්කරු නීතියට අනුව නීත්‍යානුකූල නොවන බව තහවුරු කිරීම හේතුවෙන් හා මෙම අධිකාරිය හා අදාල කථිකාචාර්යවරයා අතර විධිමත් සේවා ගිවිසුමක් තිබූ බැවින් 2009.11.01 දින සිට 2019.11.03 දින දක්වා අඛණ්ඩ සේවයක් තිබූ බව කම්කරු විනිශ්චයාධිකරණය විසින් තීරණය කර ඇත. ඒ අනුව අදාල වියදම් මුදල ගෙවීම් කර ඇත. මේ වන විට කොන්ත්‍රාත් අනියම් හා තාවකාලික පදනම මත සේවය කරන සියළු නිලධාරීන් හට සේවක අර්ථ සාධක හා භාරකාර අරමුදල් ලබා දීමට කටයුතු කරන බවද දන්වමි.

ඈ) මෙම තනතුරුලාභීන් නිපුණතා ආංශික සංවර්ධන අරමුදල යටතේ ව්‍යාපෘතියේ වැඩසටහන් සම්බන්ධීකරණය සඳහා, අදාල වකවානුව තුළ පාලක මණ්ඩල අනුමැතිය මත එක් අයෙකු සහ තිදෙනෙකු සභාපති අනුමැතිය මගින් පත්කිරීම් සිදු කර ඇත. මෙම සිවුදෙනා වෙත අපේක්ෂිත කාර්යභාරය (TOR) මත රාජකාරි කටයුතු පවරා ඇත. ඉන් පසුව මෙවැනි පත්කිරීම් සිදුකර නොමැත.

ඉ) මෙම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරියේ සභාපති මඟින් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ සභාපති වෙත යොමු කරන ලද ලිපිය අනුව මෙම ගොඩනැගිල්ල පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව දකුණු පළාත් කාර්මික සංවර්ධන අධිකාරිය වෙත ලබා දීමට දැනට සාකච්ඡා කරමින් පවතී.

ඊ) කටුබැද්ද ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ නව ප්‍රදර්ශණාගාරය සම්බන්ධව විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ වූ එකඟතාවයක් මත මෙහි ජපන් භාෂා මධ්‍යස්ථානයක් පැවැත්වීම සඳහා කටයුතු සිදු කිරීමට යෝජිත ය.

උ) දැනට මෙම ටැබ් පරිගණක යන්ත්‍ර සියල්ලම පරීක්ෂකවරුන් සඳහා බෙදා දීමට කටයුතු කර ඇත.

ඌ) ආංශික නිපුණතා අරමුදලින් 2017.10.29 දිනැති ලිපිය මඟින් සති 10ක කාලයක් තුළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම මත මෙම මුදල ගෙවීම් කරන බව දන්වා ඇත. ඒ අනුව ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ඉංජිනේරු පුහුණු අංශ 04 ක් සඳහා වූ විශේෂ දැනුම ඇති නිලධාරීන්ගේ තාක්ෂණික ඇගයීම් කමිටුවක් මඟින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මිල ගණන් කැඳවා රු. මිලියන 10 ට අඩු ප්‍රමාණයක් බැවින් මිල සැදැහුම් ක්‍රමය යටතේ කටයුතු කරන ලදී. අංශ 04 කට අදාලව සිසුන්ගේ දැනුම අලුත් කිරීමට අවශ්‍ය පරිදි උපකරණ (Slicing) ක්‍රමයට මිලදී ගැනීමට සිදුවිය.